පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වාර්ෂික වාර්තාව

2011

සභාපතිතුමාගේ පණිවුඩය

පාරිභෝගික කටයුතු අධිකාරියේ 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මා බෙහෙවින්ම සතුටු වෙමි. වෙළඳපොළ තුළ සාධාරණ වෙළඳ චර්යාවන් සහ යහපත් තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම මඟින් පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සඳහා මෙම වර්ෂය තුළදී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් වැඩසටහන් ගණනාවක්ම ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් සියල්ලම ක්‍රියාත්මක කරන ලද්දේ "විනයගරුක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයා" යන අපගේ දර්ශනය පදනම් කර ගනිමිනි.

2011 වර්ෂයේදීද දිස්ත්‍රික් ඒකක වැඩසටහන අඛණ්ඩවම ශක්තිමත් කරන ලදී. සියලුම දිස්ත්‍රික් ඒකක වෙත කාර්ය සැලසුම සමඟ ඵලදායිතා ඉලක්ක හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන හරහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාධාරණ නොවන වංචනික වෙළඳුන් වෙතින් දිවයින පුරා විසිරී සිටින පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

2011 වර්ෂය සඳහා "කන්සියුමර්ස් ඉන්ටර්නැෂනල්" විසින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි පාරිභෝගික දින තේමාව වන්නේ "අපගේ මුදල් අපගේ අයිතිවාසිකම්" යන්නයි. පාරිභෝගික අයිතිවාසිකම්, පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ලබාදෙනු ලබන සේවාවන්, මූල්‍ය ආයතනයක් තෝරාගැනීමේදී සළකා බැලිය යුතු කරුණු ආදිය සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික්ක වල පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම ජංගම පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන හරහා, පාරිභෝගික කටයුතු අධිකාරිය විසින්, දිවයින පුරා 2011 වසරේදී 15000ක පමණ පාරිභෝගික පිරිසක් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

2011 වර්ෂයේ බුත්තලදී පවත්වන ලද "දැයට කිරුළ" ප්‍රදර්ශනයට සමගාමීව පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. පාරිභෝගිකයින් උදෙසා වඩාත් හොඳ සේවාවක් ලබාදීම පිණිස පාරිභෝගික කටයුතු අධිකාරියේ නීති සහ රෙගුලාසි වලට අනුකූල වන හොඳම වෙළෙන්දන් තෝරා ගැනීම පිණිස මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වෙළෙඳුන් අතර තරඟයක් පවත්වන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06ක පාරිභෝගික සමිති පිහිටුවන ලදී. සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "ඉසුරු සවිය" වැඩසටහනටද පාරිභෝගික කටයුතු අධිකාරිය සහභාගී වී ඇත.

පාරිභෝගික කටයුතු අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ නොමසුරු සහයෝගය ලබා ගත නොහැකි වූනි නම් මෙම ජයග්‍රහණයන් අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇත. එම නිසා ඔවුන්ගේ සහයෝගය ඉතාමත් අගය කොට සලකමි.

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාගේ දූරදර්ශී නායකත්වය තුළින් අප ලද සහයෝගය ඉතාමත් අගය කරන අතර පාරිභෝගික කටයුතු අධිකාරිය ජයග්‍රාහී මාවතකට රැගෙන ඒම සඳහා අමාත්‍යාංශ ලේකම් සුනිල් එස් සිරිසේන මැතිතුමා ලබාදුන් සහයෝගය සහ මඟපෙන්වීම කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

රූමි මර්ෂූක්
සභාපති
පාරිභෝගික කටයුතු අධිකාරිය.

අපගේ දැක්ම

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයකු බිහිකිරීම

අපගේ මෙහෙවර

පාරිභෝගික සවිබලගැනවීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය කිරීම තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

අපගේ ඒකාබද්ධ ඉලක්ක

1) වෙළඳපොළ නියාමනය කිරීම මගින් තෘප්තිමත් පාරිභෝගිකයකු බිහිකිරීම.

2) අසාධාරණ වෙළඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම.

3) පාරිභෝගික අධ්‍යාපනය සහ පාරිභෝගිකයා සවිබලගැන්වීම.

4) තරඟ විරෝධී වෙළඳ චර්යාවන්ගෙන් නිෂ්පාදකයන් හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම සහ වඩාත් හිතකර තරඟකාරී වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම.

5) හැකියාවන් වර්ධනය කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟාකර ගැනීම

අපගේ ආයතනික සාරධර්ම

විශ්වාසනීයත්වය

කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම.

අවංකත්වය සහ ඒකීයත්වය

සියළුම කාර්යයන්හි දී අවංක වීම, සාධාරණ වීම සහ යුක්තිගරුක වීම.

වගකිව යුතු බව

විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතු බව සහ ඉටුකරනු ලබන කුමන හෝ කාර්යයක් සම්බන්ධයෙන් වගකීම දැරීම.

කණ්ඩායම් හැඟීම

අන්‍යෝන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලී බව වර්ධනය කරමින් පොදු ඉලක්කයන් ළඟාකර ගැනීම උදෙසා සියලුම සේවකයන් එක්ව කටයුතු කිරීම.

පිළිගැනීම

සේවකයින්ගේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම හා ප්‍රශංසා කිරීම.

කැපවීම

පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටු කිරීම.

ප්‍රතිචාර දැක්වීම

සේවා සැලයීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම් වීම.

නිර්මාණශීලී බව සහ නව්‍යතාවයන් දිරිගැන්වීම

සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා නව අදහස් උත්පාදනය කිරීම.

2 වන මහල

සතොස ලේකම් කාර්යාල ගොඩනැගිල්ල

අංක 27, වොක්ෂෝල් වීදිය

කොළඹ 02

2013.07.23

ගරු සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙත,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර 2011 වසර සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම් සහ විගණකාධිපතිගේ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

ඔබේ විශ්වාසී,

රු[illegible] මර්ෂුක්

සභාපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වාර්ෂික වාර්තාව - 2011

පටුන			පිටු අංකය
1.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය		
	1.1	හැඳින්වීම	8
	1.2	අධිකාරියේ සංයුතිය	8
	1.3	අධිකාරියේ සේවක මණ්ඩලය	9
	1.4	පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව	10
2.	අපගේ ආයතනයේ අරමුණු		10
3.	අපගේ කාර්ය භාරය		10-11
4.	විශේෂ ව්‍යාපෘති / වැඩ සටහන් - 2011		12-14
5.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ / පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්ය සාධනය - 2011		14-32
6.	2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන		33
7.	2011 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශන		34
8.	2011 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය		35-41
9.	2011 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා විගණකාධිපති වාර්තාව		42-54
10.	විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස් දැක්වීම		55-64

1 වන පරිච්ඡේදය

1.1 හැඳින්වීම

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත (173 වන අධිකාරය වූ) අහෝසි කරමින් 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම සහ අසාධාරණ සහ සීමාකාරී වෙළඳ චර්යාවන්ට එරෙහිව වෙළඳුන් හා නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමයි. තවද, හැකි සෑම අවස්ථාවක දී ම තරඟකාරී මිල ගණන් ප්‍රවර්ධනය කිරීමත්, භාණ්ඩ හා සේවා වෙළෙන්දන් හා නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

1.2 අධිකාරියේ සංයුතිය

පනතේ විධි විධාන ප්‍රකාර, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සහ පනතේ නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති සුදුසුකම් හා පළපුරුද්ද ලත් සභාපතිවරයකුගෙන් සහ තවත් සාමාජිකයන් 10 කට නොඅඩු සංඛ්‍යාවකින්, අධිකාරිය සමන්විත වේ.

අධිකාරියේ සාමාජිකයන් - 2011

2011 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පහතින් සඳහන් කර ඇත.

රූමි මර්ෂුක් මහතා	-	සභාපති
මිල්ටන් අමරසිංහ මහතා	-	පූර්ණකාලීන සාමාජික
සුනිල් ජයවීර මහතා	-	පූර්ණකාලීන සාමාජික
මේජර් ජෙනරාල් පී චන්ද්‍රවංශ මහතා	-	පූර්ණකාලීන සාමාජික
රැකව ජිනරතන හිමි		
චන්ද්‍රා ඒකනායක මෙය	-	භාණ්ඩාගාර නියෝජිත
ඒ.ජී.පී. කිත්සිරි මහතා	-	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ නියෝජිත
සුගත් මොහාන් ප්‍රැන්ක් ද සිල්වා මහතා		
දුෂාන් සෝසා මහතා		
විනෝද් ජී. දන්සින්ගානි මහතා		

ජේ.එම්. ඒ ජයතිලක ජයසුන්දර මහතා

වරුණ අලව්ව මහතා

අනුර ප්‍රනාන්දු මහතා

අනිල් කුමාර සේනාධීර මහතා

බැසිල් වැන්ලන්ගන්බර් මහතා

ඩබ්ලිව්. ඒ.සී. හේමකුමාර මහතා

ආර්.බී. තෙන්නකෝන් මහතා

මේජර්. වයි.එච්.පී.එන්.වයි. සේනාධිපති මහතා

එම්.බී.එම්. ඉබ්‍රහිම් මහතා

එච්.එම්.එල්.එච්. බණ්ඩාර හේරත් මහතා

මාධව සංජීව වත්තේගම මහතා

වෛද්‍ය ජයන්ත බලවර්ධන මහතා

මේජර් ජෙනරාල් විජිත වැලිකල මහතා - 2011.05.27 දින ඉල්ලා අස්වී ඇත.

ප්‍රියන්ත මායාදුන්න මහතා - 2011 මාර්තු මස ඉල්ලා අස්වී ඇත.

හනිෆ යූසුෆ මහතා

එම්.එච්.එම්. ෂෙරිෆ මහතා

1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

2011 වර්ෂය තුළ දී රූමි මර්ෂූක් මහතා අඛණ්ඩව සභාපතිවරයා ලෙස කටයුතු කරන ලදී. 2011 වර්ෂය තුළ දී චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය (අධ්‍යක්ෂ, පාරිභෝගික කටයුතු සහ තොරතුරු) වැඩ බලන අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස කටයුතු කරන ලදී.

අධිකාරියේ අංශ භාර ප්‍රධානීන් - 2011

දීප්ති තිසේරා මහත්මිය

M.PA.(PIM-Sri J), Attorney –at-Law - අධ්‍යක්ෂකා (අනුකූලවීම් සහ බලගැන්වීම්)

චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය - අධ්‍යක්ෂකා (පාරිභෝගික කටයුතු සහ තොරතුරු)

B.Sc.Agri (Sp), M.Sc, (Mgt)

ශාන්තිනී තිරුනීලකන්දන් මහත්මිය - අධ්‍යක්ෂකා (තරඟකාරිත්ව ප්‍රවර්ධන)
ACEA

ඩබ්ලිව්.එම්. ප්‍රියන්ත මහතා - අධ්‍යක්ෂ (මූල්‍ය)

MPM, B.Com.(Sp), AIPFM, DPFM

සම්පත් අඟුලුගහ මහතා - අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන)

B.Com.(Sp) Hons, AIPM (SL), Dip. in PM

2011 වර්ෂය තුළ දී රොහාන් මීවනගේ මහතා අධ්‍යක්ෂ (මිල කිරීම් හා කළමනාකරණ) තනතුරේ රාජකාරී ඉටුකරන ලදී.

1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පනතේ iv කොටසේ විධිවිධාන ප්‍රකාර පාරිභෝගික කටයුතු සභාව පිහිටුවා ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයන් - 2011

උපාලි සේනාරත්න මහතා	-	සභාපති
වසන්ත ගුණවර්ධන මහතා	-	සාමාජික
සුදත් විජේවික්‍රම මහතා	-	සාමාජික

සභාවේ ලේකම් - ලේඛා ආරියරත්න මෙය (නීතිඥ)

2. අධිකාරියේ අරමුණු

අධිකාරියේ අරමුණු පහත දක්වා ඇත.

(අ) පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම ;

(ආ) අසාධාරණ වෙළඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම ;

(ඇ) හැකි සෑම විටම, පාරිභෝගිකයන්ට, තරඟකාරී මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම ;

(ඈ) අසාධාරණ වෙළඳ පිළිවෙත්, සීමාකාරී වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන සැලසීම.

3. අධිකාරියේ කර්තව්‍යන්

අධිකාරියේ කර්තව්‍ය පහත ද ැක්වෙන පරිදිය.

(අ) i ව්‍යවසායන් අතර සීමාකාරී වෙළඳ ගිවිසුම්

ii ව්‍යවසායන් අතර මිල පිළිබඳ වැඩ පිළිවෙලවල්

iii වෙළඳපොළ ඇතුළත හෝ වෙළඳපොලේ සැලකිය යුතු කොටසක දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම ;

හෝ

iv දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිළිබඳ යම් අවහිරයක් පාලනය කිරීම හෝ ඉවත් කිරීම ;

(ආ) තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදු කිරීම ;

(ඇ) භාණ්ඩ සහ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීතවය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගත හැකිවීම සහ ඒවායෙහි සමානත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, මිල දී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිත කරන අයගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඉ) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම;

(ඊ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම ;

(උ) වෙළඳපොළ තරඟකාරීත්වය අඩු ඵලදායිතාවන් පවතන අවස්ථාවල දී වෙළඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) වෙළඳපොළ තත්ත්ව සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාරගැනීම, වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම ;

(එ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාර ගැනීම ;

(ඒ) පාරිභෝගිකයන්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) වෙළඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම ;

(ඕ) පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ දිරිමත් කිරීම ;

(ක) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම ;

(ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත්කිරීම ; සහ

(ච) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලුම කටයුතු සිදු කිරීම.

4. විශේෂ ව්‍යාපෘති / වැඩ සටහන් - 2011

2011 වර්ෂය තුළදී පාරිභෝගික කටයුතු අධිකාරිය මඟින් සපයනු ලබන සේවාවන්හි ගුණත්වය වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති / වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට හැකි විය.

* දිස්ත්‍රික් ඒකක ශක්තිමත් කිරීම

මෙම වැඩ සටහන 2011 වර්ෂය තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. අපේක්ෂිත ඉලක්ක සහිතව සියලුම දිස්ත්‍රික් ඒකක සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වා දී ඇති අතර, එක් එක් පුද්ගලයාගේ සහ කණ්ඩායම්වල කාර්යසාධනය ඇගයීම සඳහා සෑම මසකම අග භාගයේ දී කාර්ය සාධන ඇගයීම් සිදු කරන ලදී. මෙම වැඩ සටහන අඛණ්ඩව පවත්වාගෙන යාම මඟින්, විශේෂයෙන් ම වෙළඳපොළ විමර්ශන සහ වැටලීම් සිදු කිරීම මෙන්ම නීති විරෝධී වෙළෙන්දන් වෙතින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකි විය.

ජංගම දුරකථන සහ අන්තර්ජාල සම්බන්ධතා වැනි අවශ්‍ය කෙරෙන සම්පත්, දිස්ත්‍රික් ඒකක වෙත සපයා දීමට වැඩිදුර ක්‍රියාමාර්ග ගන්නා ලදී. දිස්ත්‍රික් ඒකක විසින් කුලී පදනම මත ලබාගත් වාහන වෙනුවට එම ඒකක වෙත වාහන වෙන් කර දීම සඳහා වාහන ලබාදෙන මෙන් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් භාණ්ඩාගාරය වෙතින් ඉල්ලීමක් කරන ලද අතර, ඒ අනුව වෙළඳපොළ වැටලීම් සහ විමර්ශන සිදුකිරීම සඳහා වෙන්කර දීමට 2012 වසර ආරම්භයේ දී ආසන 15 ක් සහිත වෑන් රථ හතරක් සහ ඩබල් කැබ් රථයක් ලබාදෙන ලදී.

* විමර්ශන නිලධාරීන් සඳහා සේවක මණ්ඩල සංවර්ධන වැඩ සටහන

2011 වර්ෂයේ සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස තුළදී විමර්ශන නිලධාරීන් සඳහා දෙදින නේවාසික සංවර්ධන වැඩ සටහනක් පවත්වන ලදී. මෙම වැඩ සටහනේ මූලික පරමාර්ථය වන්නේ වෙළඳපොළ විමර්ශන සිදු කිරීමේ දී නිලධාරීන් විසින් මුහුණපාන ගැටලු හඳුනාගැනීමත්, වැරදි සහගත වෙළෙන්දන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමත් සහ ඒ සඳහා ප්‍රායෝගික විසඳුම් ලබාදීමත් ය. වැඩ සටහන් තුළ දී විමර්ශන නිලධාරීන් කණ්ඩායම් කිහිපයකට බෙදා මනෝ මූලික හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ සැසි වාර පවත්වන ලද අතර, කණ්ඩායම් නායකයන් විසින් දේශනයන් සිදු කරන ලදී. වැඩිමනත් අභිවෘද්ධිය

අවශ්‍යතාවන් ඇති ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා මනෝමූලික හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ සැසි වාරයන්හි දී ඉදිරිපත් කරන ලද අදහස, ඉහළ කළමනාකරණය සහ බාහිර සම්පත්දායකයන් විසින් සමාලෝචනයට ලක් කරන ලදී.

* පාරිභෝගික අයිතිවාසිකම් උන වැඩ සටහන - 2011

Consumers International විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි පාරිභෝගික අයිතිවාසිකම් දින තේමාව වූයේ "අපගේ මුදල්, අපගේ අයිතීන්" යන්නය. පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් පාරිභෝගික අයිතිවාසිකම්, ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දින තේමාව, පාරිභෝගික කටයුතු අධිකාරියේ සේවාවන්, අවශ්‍යතාවන් මුදුන් පමුණුවා ගත හැකි වන පරිදි ආරක්ෂිත හා විශ්වාසදායී මූල්‍ය ආයතන තෝරාගැනීම සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ආශ්‍රිත ආයතන ආදිය සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික්කයන්හි ජංගම දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් උපදෙස් පත්‍රිකා සහ අත්පොත්, බස් නැවතුම්පොළ, දුම්රිය ස්ථාන සහ වෙළඳසැල්, පාසල් සහ රජයේ ආයතන හා බැංකු ආදිය අසළ බෙදා හැරීමට කටයුතු කරන ලදී. පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මහ බැංකුවේ සහාය ද ලබා ගන්නා ලදී. 2011 මාර්තු මස 15 වන දින, පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් දිවයින පුරා පාරිභෝගිකයන් 15000 ක් පමණ දැනුවත් කිරීම සඳහා පියවර ගෙන ඇත. තව ද, විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ද පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා පියවර ගන්නා ලදී. ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දින තේමාව සම්බන්ධයෙන් මහ බැංකුවේ සහාය ඇතිව පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් රූපවාහිනී වැඩ සටහනක් ද පවත්වන ලද. "අපගේ මුදල් අපගේ අයිතීන්" යන තේමාව යටතේ පුවත්පත් අතිරේකයක් ද පළකරන ලදී.

* බුත්තල උ පවත්වන ලද දැයට කිරුළ - 2011

මොණරාගල දිස්ත්‍රික්කයේ පවත්වන ලද දැයට කිරුළ වැඩ සටහන සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය ක්‍රියාකාරී අන්දමින් සහභාගි විය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුළ ම පවත්වන ලද සියලුම දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය සහභාගි විය. මොණරාගල දිස්තක්කයේ ජාතික පාසල්වල මෙම දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලද අතර, පාසල් ළමුන් අතර චිත්‍ර තරඟයක් ද පවත්වන ලදී. ජයග්‍රාහකයන් සඳහා දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ දී ත්‍යාග ප්‍රදානය කරන ලදී.

පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් හඳුන්වාදෙන ලද රීති හා රෙගුලාසි සමඟ අනුගත වන හොඳම වෙළෙන්දන් තේරීම සඳහාත් සහ පාරිභෝගිකයන් වෙත වඩාත් හොඳ මට්ටමේ සේවාවන් පිරිනමනු ලබන වෙළෙන්දන් තෝරාගැනීම සඳහාත්, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වෙළෙන්දන් අතර තරඟයක් පවත්වන ලදී. මෙම වැඩ සටහන යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අලෙවිසැල් 1132 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. එක් ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයකින් වෙළෙන්දන් තිදෙනෙකු බැගින් තෝරා "ආදර්ශ අලෙවිසැල් තරඟයෙ" ජයග්‍රාහකයන් වෙත එකී ප්‍රදර්ශන භූමියේ දී ගරු සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා විසින් ත්‍යාග පිරිනමන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ පාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක පාරිභෝගික සමිති පිහිටුවන ලදී.

සහභාගිවන්නන් සඳහා ප්‍රදර්ශන කුටියක ප්‍රශ්නෝත්තර තරඟයක් පවත්වන ලද අතර, සෑම පැය දෙකකට වරක් ම ජයග්‍රාහකයින් තෝරන ලදී. මෙම වැඩ සටහන මඟින් මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාව අතර දැනුම ව්‍යාප්ත කිරීමට ද හැකි විය. තව ද පාරිභෝගිකයා දැනුවත් කිරීමේ කව සහ වීඩියෝ දර්ශන හරහා මහජනතාව දැනුවත් කිරීමට ද පියවර ගන්නා ලදී.

*   **කුරුණෑගල දී පවත්වන ලද "ඉසුරු සවිය" වැඩ සටහන**

2011 ජුනි මාසය තුළ දී මෙම වැඩ සටහන පවත්වන ලදී. සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද මෙම වැඩ සටහනට පාරිභෝගික කටයුතු අධිකාරිය ද සහභාගි විය. පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සංවිධානය කළ ප්‍රදර්ශන කුටිය පාරිභෝගිකයා දැනුවත් කිරීමේ කවුළුවකින් හා පාරිභෝගික කටයුතු අධිකාරියේ සේවාවන් සම්බන්ධයෙන් අධ්‍යාපනික වීඩියෝ දර්ශන, බැනර් සහ පෝස්ටර්වලින් ද සමන්විත විය. පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක ආදර්ශ අලෙවිසැල් තරඟයක් පවත්වන ලදී. ඉසුරු සවිය ප්‍රදර්ශනයේ දී ජයග්‍රාහකයන් වෙත කුසලාන ප්‍රදානය කරන ලදී. නීතියට අනුකූල වන සහ අනුකූල නොවන ආකාරයේ දර්ශන ඇතුළත්ව රීති හා රෙගුලාසි සම්බන්ධයෙන් ප්‍රදර්ශන කුටි දෙකෙක් හරහා ව්‍යාපාරික ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

*   **වෙළඳපොළ විමර්ශන පරිගණකගත කිරීම**

ප්‍රධාන කාර්යාලය වෙත අවශ්‍ය කෙරෙන තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදය වැළැක්වීම සඳහා ප්‍රධාන කාර්යාලය සමඟ සියලුම දිස්ත්‍රික් ඒකක ජාලගත කිරීමේ අරමුණින් වෙළඳපොළ වැටලීම් සහ නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පරිගණක වැඩ සටහනක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලදී. සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඊ-සර්විසස් ලංකා ලිමිටඩ් විසින් මෙම වැඩ සටහන සංවර්ධනය කරන ලදී. දිස්ත්‍රික් ඒකක සඳහා පරිගණක සහ අන්තර්ජාල සම්බන්ධතා සපයා දෙන ලදී. විමර්ශන නිලධාරීන් සඳහා මූලික පුහුණු සැසිවාරයක් අවසන් කරන ලදී.

*   **පාරිභෝගික සහ වෙළඳ තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීම**

මහජනතාව සහ ව්‍යාපාරික ප්‍රජාව වෙත අවශ්‍ය තොරතුරු සපයාදීම සඳහා පාරිභෝගික සහ වෙළඳ තොරතුරු මධ්‍යසථානය පිහිටුවන ලදී. පාරිභෝගික කටයුතු අධිකාරියේ සේවාවන් සම්බන්ධයෙන් තොරතුරු අවශ්‍ය කෙරෙන පාරිභෝගිකයන් සහ වෙළඳුන් හට අධිකාරියේ නිලධාරීන් හමු වී අදාළ තොරතුරු ලබාගත හැකිය. අත් පත්‍රිකා සහ අත්පොත්, අධිකාරිය විසින් නිකුත් කළ විධාන සහ නියෝග පිළිබඳ පිටපත්, එක්රැස් කළ හැකිය.

5.   පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්ය සාධනය

සංවිධාන ව්‍යුහය අනුව අධිකාරිය, අධ්‍යක්ෂවරු 06 දෙනෙක් යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරී අංශ 06 කින් සමන්විතය. මෙම අංශයන්, පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය, අනුකූලතා සහ බලගැන්වීමේ අංශය, මිල කිරීම් හා කළමනාකරණ අංශය, තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය, මූල්‍ය අංශය සහ මානව සම්පත් සහ පරිපාලන අංශය ලෙස නම් කොට ඇත.

2011 වර්ෂය තුළ දී පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්ය සාධනය පහතින් දක්වා ඇත.

1)   උපද්‍රවකාරී සහ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ හා සේවාවන්ට එරෙහිව පාරිභෝගිකයා ආරක්ෂා කිරීම.

(අ) **<u>පනතේ 10 වන වගන්තිය යටතේ නිකුත් කළ විධාන</u>**

- **<u>විධාන අංක 32</u>**

පුවත්පත්, චිත්‍රපට, රූපවාහිනිය, වීඩියෝ දර්ශන, ශ්‍රව්‍ය මාධ්‍ය, අන්තර්ජාල හෝ වෙනත් යම් මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් හෝ ඉලෙක්ට්‍රොනක මාධ්‍යයන්හි ප්‍රචාරය කරනු ලබන යම් අයිතමයක් හෝ අයිතම විකිණීම සම්බන්ධයෙන් වන සෑම වෙළඳ දැන්වීමකට එකී අයිතමය හෝ අයිතමයන්ගේ සිල්ලර මිල විශේෂයෙන් ම සඳහන් කළ යුතු බව පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සියලුම නිෂ්පාදකයන්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙන්දන් වෙත මෙම නියෝගය මඟින් නිවේදනය කොට ඇත. මෙම නියෝගය නිකුත් කිරීමේ පරමාර්ථය වූයේ පාරිභෝගිකයාට මිලදී ගැනීමට අවශ්‍ය කෙරෙන නිෂ්පාදනයන්හී සිල්ලර මිල පිළිබඳ නිරවද්‍ය තොරතුරු දැනගැනීමේ පාරිභෝගික අයිය සාක්ෂාත් කිරීමයි. පුවත්පත් දැන්වීම් හරහා දැනුවත් කිරීම සම්බන්ධයෙන් පියවර ගන්නා ලදී. ඉන් අනතුරුව වෙළඳපොළ වැටලීම් සිදුකරන ලද අතර, මෙම නියෝගය උල්ලංඝනය කළ නිෂ්පාදකයන් සහ වෙළෙන්දන් කිහිපදෙනෙකුට එරෙහිව අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පවරන ලදී.

- **<u>විධාන අංක 33</u>**

ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් කර ඇති, දේශීය වශයෙන් නිපදවන ලද එළවලු සහ පළතුරු අස්වැන්න නෙලීමේ දී, එකතු කිරීමේ දී, ගබඩා කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ ද, ප්‍රදර්ශනය කිරීමේ දී සහ විකිණීමට ඉදිරිපත් කිරීමේ දී, ප්ලාස්ටික් සහ කඩදාසි හෝ ලී වලින් තනන ලද ඇසුරුම් භාවිතා කළ යුතු බවට සියලුම නිෂ්පාදකයන්, ප්‍රවාහනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙන්දන් වෙත, පාරිභෝගක කටයුතු අධිකාරිය විසින් මෙම නියෝගය නිකුත් කිරීමේ අරමුණ වන්නේ එළවලු සහ පළතුරුවල පසු අස්වනු හානය අවම කිරීමත්, නිෂ්පාදකයාගේ ලාභය ඉහළ නැංවීමත්, පාරිභෝගිකයා වෙත හොඳ තත්ත්වයේ එළවලු සහ පළතුරු සාධාරණ මිල ගණන් යටතේ ලබා ගැනීමට පහසුකම් සැලසීමත් ය.

- **<u>විධාන අංක 35</u>**

සියලුම නිෂ්පාදකයන් සහ වෙළෙන්දන් විසින් නිශ්චිතව දක්වා ඇති අයිතමයන්හි, අදාළ අයිතමය මත හෝ ඇසුරුම මත හෝ බඳුන මත හෝ කවරය මත උපරිම සිල්ලර මිල, භාණ්ඩ අංකය, කල් ඉකුත් වන දිනය, නිෂ්පාදිත දිනය, නිෂ්පාදිතයේ ශුද්ධ බර / පරිමාව ආදිය සළකුණු කළ යුතු බවට නියෝග කරමින් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මෙම විධානය නිකුත් කරන ලදී. එකී නිශ්චිත භාණ්ඩ වන්නේ හිස ගල්වන තෙල්, ජෙල් හා ක්‍රීම් වර්ග, ෂැම්පු, ලෝෂන් වර්ග, පවුඩර් වර්ග ඇසුරුමක හෝ බඳුනක බහා අලෙවි කරන රටඉදි, මුද්දරප්පලම්, ඇසුරුම් කළ ආහාර වර්ණක, ආහාර රසකාරක, ආහාර සඳහා යොදන එසෙන්ස් වර්ග, ක්ෂණික ආහාර ඇසුරුම් කළ පිරිසිදු කාරක සබන් වර්ග, මෝටර් රථ පිරිසිදු කිරීමට ගන්නා ඇසුරුම් කළ සේදුම්කාරක, වාහනයේ ඉදිරිපස ආවරණ වීදුරු (Windscreen) පිරිසිදු කිරීමට ගන්නා පිරිසිදුකාරක, ඇසුරුම්ගත ආයුර්වේදීය නිෂ්පාදන මෙම විධානය නිකුත් කිරීමේ අරමුණ වන්නේ පාරිභෝගිකයා මිලදී ගැනීමට අපේක්ෂා කරන නිෂ්පාදනයන් පිළිබඳ නිරවද්‍ය තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් වූ පාරිභෝගික අයිතිය සාක්ෂාත් කිරීමයි.

* **<u>විධාන අංක 37</u>**

විද්‍යුත් සහ/හෝ ඉලෙක්ට්‍රොනික අයිතිමයන් / උපකරණ / උපාංග /මෙවලම් සම්බන්ධයෙන් එකී අයිතමය ගැණුම්කරු විසින් මිලදී ගත් දින සිට හෝ එහි සන්තකය ගැණුම්කරු වෙත පැවරූ දින සිට මාස 06 කට නොඅඩු වගකීමේ කාලයක් ඒ සඳහා ලබා දිය යුතු බවට සඳහන් මෙම නියෝගය පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සියලුම විද්‍යුත් සහ/හෝ ඉලෙක්ට්‍රොනික අයිතිමයන් නිෂ්පාදකයන්ට, වෙළෙන්දන්ට සහ ආනයනකරුවන් වෙත නිකුත් කරන ලදී.

- **<u>විධාන අංක 38</u>**

ජීවන වියදම සහ ආහාර සුරක්ෂණය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ නිර්දේශ මත 38 වන විධානය මගින් 33 වන විධානය අහෝසි කරන ලදී. 38 වන විධානය ප්‍රකාර ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති දේශීය වශයෙන් නිපදවන එළවලු හා පළතුරු නෂ්පාදකයන්, ප්‍රවාහනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙන්දන් විසින් එකී එළවලු සහ පළතුරු අස්වනු නෙළීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සඳහා ප්ලාස්ටික, ඝන කඩදාසි හෝ ලීවලින් නිම කරන ලද ඇසුරුම් භාවිත කළ යුතු බව මේ මගින් විධානය කෙරේ.

(ආ) **භාණ්ඩවල ගුණත්වය සහතික කිරීම සඳහා ප්‍රමිතීන් යොදා ගැනීම**

වෙළඳපොළ තුළ පවතින භාණ්ඩ වල ගුණත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් පනතේ 12 වන වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් 2011 වර්ෂය තුළ දී විධානයන් 02 ක් නිකුත් කරන ලදී.

- **විධාන අංක 34**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද SLS භාණ්ඩ සහතික කිරීමේ සළකුණු නොමැතිව දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද, මැටිවලින් නිම වූ යම් උළු වර්ගයක් නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම හෝ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, තොග හෝ සිල්ලර වශයෙන් විකිණීමට ඉදිරිපත් කිරීම, කිසිදු නිෂ්පාදකයකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දකු සිදු නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මෙයින් නිවේදනය කරයි.

- **විධාන අංක 36**

කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවකු, ඇසුරුම්කරුවකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් නිශ්චිතව දක්වා ඇත අදාළ මුලු ර්යම් සංයුතියට අනුකූල නොවන යම් තීන්ත වර්ගයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, භාවිත කිරීම හෝ බෙදාහැරීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීමට පාත්‍ර කිරීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, තොග වෙළඳාම හෝ සිල්ලර වෙළඳාම නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු අධිකාරිය මෙයින් නියෝග කරයි. මෙම විධානය නිකුත් කිරීමේ අරමුණ වන්නේ සෞඛ්‍යමය උපද්‍රවවලට හේතු විය හැකි හානිකර රසායනික ද්‍රව්‍යයන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීමයි. මෙම විධානය 2013 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

(අ) **ප්‍රමිතියෙන් තොර ආනයනික භාණ්ඩ අධීක්ෂණය කිරීම**

ප්‍රමිතියෙන් තොර භාණ්ඩ රට තුළට ඇතුලුවීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සහයෝගීව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. එවැනි කාරණා 93 ක් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදු කළ අතර, ආනයන විමර්ශන යෝජනා ක්‍රමය මඟින් එම භාණ්ඩ ප්‍රති අපනයනය කරන ලෙස නිර්දේශ කරන ලදී.

(ඇ) **ජාතික කමිටු නියෝජනය කිරීම සහ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති / ව්‍යවස්ථා හඳුන්වාදීම සඳහා දායක වීම.**

පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සෞඛ්‍යය අමාත්‍යාංශය, විදුලිය සහ බලශක්ති අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සභාව ආදිය යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කෙරේ. තව ද පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාවන් හඳුන්වාදී ම ද මෙහි කර්තව්‍යයකි.

(2) වංචා සහගත ක්‍රියාමාර්ග ස හ අසාධාරන වෙළඳ චර්යාවන්ට එරෙහිව පාරිභෝගිකයා ආරක්ෂා කිරීම

(අ) ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ විධිවිධාන ප්‍රකාර අනුකූලතාවක් දැක්විය යුතු නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය පියවර ගෙන ඇති අතර, සාධාරණ ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා සහාය දක්වා ඇත. අධිකාරිය විසින් වාණිජ මණ්ඩලය, වෙළඳුන්ගේ සංගම් සහ සමාගම් වෙත පුහුණු වැඩමුලු පවත්වයි. 2011 වර්ෂය තුළ දී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව වෙත වැඩ සටහන් 250 ක් පවත්වා ඇත.

(ආ) වෙළඳපොළ පරීක්ෂාව

වෙළෙන්දන් විසින් සිදුකරනු ලබන වැරදි ලෙස පොදු අයථා ක්‍රියා මාර්ග ගණනාවක් පාරිභෝගික කටයුතු අධිකාරී පනත විසින් හඳුන්වා දී ඇත. පනත විසින් හඳුන්වා දී ඇති එවැනි අයථා ක්‍රියා මාර්ග ගණනාවක් ලෙස ලේබල් කිරීමේ උපදෙස් උල්ලංඝනය කිරීම, සළකුණු කළ මිලට වඩා වැඩි වටිනාකමකට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සන්තකයේ තබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ තොග රහසිගතව ගබඩා කිරීම, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය රහිතව නිශ්චිත භාණ්ඩවල සිල්ලර සහ තොග මිල ඉහළ දැමීම, මිල ලැයිස්තු ප්‍රදර්ශනය නොකිරීම, ගැණුම්කරුවන්ට රිසිට්පත් නිකුත් නොකිරීම, නොමඟ යැවීම් හෝ වංචාසහගත ක්‍රියා මාර්ග සහ නිෂ්පාදකයින් / වෙළඳුන් විසින් සිදු කරනු ලබන අසත්‍ය නියෝගයන් නම් කළ හැකිය. අධිකාරිය විසින් විධිමත් වෙළඳපොළ පරීක්ෂාවන් සිදු කරනු ලබන අතර, පනත උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වෙළඳපොළ වැටලීම් සිදු කරයි. වැරදි සහගත වෙළෙන්දන්ට එරෙහිව අදාළ මහෙස්ත්‍රාත් අධිකරණවල නඩු පවරන අතර, පනතේ 60 වන වගන්තිය මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාර දඩ මුදල් පනවනු ලැබේ.

වර්ෂය තුළ දී අධිකාරිය විසින් වෙළඳපොළ වැටලීම් 36041 පවත්වා ඇති අතර, ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සහ දිස්ත්‍රික් ඒකකවලට අනුයුක්ත කොට ඇති නිලධාරීන් විසින් මෙම වැටලීම් සිදුකොට ඇත. මෙය පූර්ව වර්ෂයට වඩා 2.3 ගුණයක ඉහළ යාමකි. 2011 වර්ෂයේ දී පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වැරදි සහගත වෙළෙන්දන් වෙත පනවා ඇති දඩ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 88.486 කි. මෙය පසුගිය වර්ෂයට වඩා 2.1 ගුණයක වර්ධනයක් පෙන්නුම් කරයි. වෙළඳපොළ වැටලීම් සහ රජයට අය වූ දඩ මුදල්වල ප්‍රගතිය පිළිවෙලින් වගුව 1 සහ 2 මගින් පෙන්නුම් කරයි.





(ඇ) **<u>හඳුනාගත් ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල ක්‍රියාත්මක කිරීම</u>**

"දිවයිනට ප්‍රවේශ වන වරායේ දී ම හඳුනාගත් අයිතමයන් පහක් සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල සලකුණු කිරීම" පිළිබඳව වූ ගැසට් පත්‍රය ක්‍රියාත්මක කිරීමත සමඟ අඩුවෙන් මිල සලකුණු කිරීම බොහෝ දරට වැළැක්වෙන නිසා රේගු දෙපාර්තමේන්තුවට සැලකිය යුතු මට්ටමේ ආදායමක් ලබාගත හැකි විය. වර්ෂය තුළ දී අධිකාරිය වෙත අයදුම්පත් 330 ක් ලැබී තිබෙන අතර එම සියලුම අයදුම්පත් ඉවත් කොට ඇත.

3. **<u>අසාධාරණ වෙළඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම</u>**

(අ) **<u>පාරිභෝගක පැමිණිලි මෙහෙයවීම</u>**

පනතේ 13 සහ 32 වගන්ති මගින් සලසා ඇති විධිවිධාන පාදක කර ගනිමින් පාරිභෝගික කටයුතු අධිකාරිය, පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරයි. 12 වගන්තිය යටතේ නිශ්චය කර ඇති ප්‍රමිතීන් සහ පිරිවිතරයන්ට අනුකූල නොවන භාණ්ඩ අලෙවිය සහ සේවා සැපයීම සහ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් වංචාසහගත ලෙස වගකීමේ සහතිකයට අනුකූල නොවන යම් භාණ්ඩයක් අලෙවි කිරීම සම්බන්යෙන් වූ පැමිණිලි අධිකාරියට විමර්ශනය කළ හැකිය.

2011 වර්ෂය තුළ දී අධිකාරියට පැමිණිලි 1604 ක් ලැබී තිබුණු අතර, පාර්ශ්වකරුවන් සෑහීමට පත්වන පරිදි පැමිණිලි 604 ක් සාර්ථක ලෙස නිරවුල් කරන ලදී. දිස්ත්‍රික් ඒකක වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 32 ක් වූ අතර, වෙළඳපොළ වැටලීම් සඳහා යොමු කළ පැමිණිලි සංඛ්‍යාව 683 කි. 2011 වර්ෂය තුළ දී, පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය 3 සහ 4 වගු මගින් පෙන්නුම් කෙරේ.

<u>වගුව 3 : 2011 වර්ෂය තුළ දී පාරිභෝගික පැමිණිලි මෙහෙයවීමේ ප්‍රගතිය</u>

පාරිභොගික පැමිණිලි	2011
ලද පැමිණිලි	1591
වෙනත් ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි	158
දිස්ත්‍රික් ඒකක වෙත යොමු කරන ලද පැමිණිලි	31
වෙනත් අංශ වෙත යොමු කරන ලද පැමිණිලි	115
වැටලීම් සඳහා යොමු කරන ලද පැමිණිලි	688
අසා නිම කළ පැමිණිලි	593
ප්‍රතික්ෂේප කළ පැමිණිලි	83
සාකච්ඡා වට බඳුන් කළ පැමිණිලි	291

වගුව 4 : පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමේ ප්‍රගතිය

විමසුම්	2011
ස්ථිර	124
නිරවුල් කරන ලද	26
නියෝග නිකුත් කිරීම්	24
සාකච්ඡාවට බඳුන් කළ (විමර්ශනයට පෙරාතුව)	23

4. පාරිභෝගික අධ්‍යාපනය සහ පාරිභෝගිකයා බලගැන්වීම

(අ) පාරිභෝගකයා දැනුවත් කිරීමේ වැඩ සටහන්

පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම්, වර්තමාන පාරිභෝගික නීතිය, වඩා හොඳ පාරිභෝගික ආචාර ධර්ම සහ වඩා හොඳ ව්‍යාපාරික චර්යාවන් ආදිය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය, සම්මන්ත්‍රණ, වැඩමුළු, ප්‍රදර්ශන, පාරිභෝගික අයිතිවාසිකම් දින වැඩ සටහන් ආදිය භාවිතා කරයි.

2011 වර්ෂය තුළ දී, පාසල් ළමුන්, විශ්ව විද්‍යාල සිසුන්, රජයේ නිලධාරීන්, ප්‍රජා සංවිධාන, ගෘහණියන් සහ මහජනතාව වැනි පාරිභෝගික කණ්ඩායම් සඳහා අධිකාරිය විසින් පාරිභෝගිකයා දැනුවත් කිරීමේ වැඩ සටහන් 107 ක් පවත්වන ලදී. පාරිභෝගික කටයුතු අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් ඒකක විසින් මෙම වැඩ සටහන් පවත්වන ලදී. මෙම වැඩ සටහන් පාරිභෝගික කටයුතු අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මෙන් ම දිස්ත්‍රික් ඒකක විසින් ද පවත්වන ලදී. මෙම වැඩ සටහන්වලට අමතරව මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ප්‍රදර්ශන හා වෙළඳ සල්පිල් සඳහා දායකත්වය ලබා දී ඇත.

වගුව 5 : 2011 වර්ෂය තුළ දී පවත්වන ලද පාරිභෝගික අධ්‍යාපන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු

වැඩ සටහන	වැඩ සටහන් සංඛ්‍යාව	2011	
		සහභාගී වූවන් සංඛ්‍යාව	පාරිභෝගික සංවිධාන / පාසල් පාරිභෝගික සමාජ සංඛ්‍යාව
මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන්	83	28,648	-
පාසල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන්	24	4,052	-
වෙළෙන්දන් දැනුවත් කිරීමේ වැඩ සටහන්	152	8,395	-
පාරිභෝගික සංවිධාන පිහිටුවීම	51	-	51
පාසල් පාරිභෝගික සමාජ පිහිටුවීම	03	1,140	33
එළවලු සහ පළතුරු සඳහා යෝග්‍ය ඇසුරුම් භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්	98	6,846	-
මාධ්‍ය හරහා දැනුවත් කිරීම (මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික) (මාධ්‍ය නිවේදන සහ වෙළඳ දැන්වීම්)	69	-	-
ප්‍රදර්ශන	02	312,000	-
මහජනතාව වෙත පත්‍රිකා බෙදාහැරීම	08	15,450	-
එකතුව	**490**	**376,531**	**84**

දැයට කිරුළ වැඩ සටහනට සමගාමීව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩ සටහන්

2011 / 2012 : අනුරාධපුරය

පහත සඳහන් වැඩ සටහන් ඇතුළත් වන පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ දී පවත්වන ලද විශේෂ දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය.

* රජයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන්
* ආදර්ශ අලෙවි සැල් තරඟ ක්‍රියාත්මක කිරීම.
* පාරිභෝගික සංවිධාන සහ පාසල් පාරිභෝගික සමාජ පිහිටුවීම
* ප්‍රදර්ශන කුටි

(ආ) <u>දැනුවත් කිරීමේ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම</u>

වර්ෂය තුතළ දී අධිකාරිය විසින් දැනුවත් කිරීමේ ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත් කොට ඇත.

(ඇ) <u>පාරිභෝගික සංවිධාන සහ පාසල් පාරිභෝගික සමාජ පිහිටුවීම</u>

2011 වර්ෂය තුළ දී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇති අතර, මේ යටතේ විවිධ දිස්ත්‍රික්කවල පාරිභෝගික සංවිධාන 51 ක් සහ පාසල් පාරිභෝගික සමාජ 33 ක් පිහිටුවීමට හැකි වී ඇත.

5. තරඟ විරෝධී වෙළඳ චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සහ සාධාරණ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

(අ) <u>**තරඟකාරිත්ව ප්‍රවර්ධනය**</u>

තරඟකාරිත්ව ප්‍රවර්ධනයේ මූලික පරමාර්ථය වන්නේ නිදහස් හා සාධාරණ වෙළඳපොළ ව්‍යුහයක් ස්ථාපිත කිරීමත් සහ වෙළෙන්දන් අතර සාධාරණ තරුණකාරිත්වයක් ප්‍රවර්ධනය කිරීමයි. 2011 වර්ෂය තුළ දී අත්පත්කර ගත් තරඟකාරිත්ව ප්‍රවර්ධන ක්‍රියාකාරකම් 6 වගුවේ දක්වා ඇත.

<u>වගුව 6 : තරඟකාරීත්ව ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය</u>

<u>ක්‍රියාකාරකම්</u>	**<u>ප්‍රගතිය</u>**
(අ) පොදු යහපතට එරෙහිව ක්‍රියාත්මක වන තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධයෙන් මැදිහත් වීම. ඖෂධ වර්ග සිල්ලර වෙළඳ කටයුතුවල දී සිදුවිය හැකි තරඟ විරෝධී චර්යාවන් හඳුනාගැනීම සඳහා අප විසින සවාධීනව පරීක්ෂණ ආරම්භ කරන ලදී.	01
(ආ) **<u>වෙළඳ කටයුතු ආශ්‍රිත පැමිණිලි විමර්ශනය කිරීම.</u>** තරඟ විරෝධී සහ අසාධාරන වෙළඳ චර්යාවන් සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම.	28
(ඇ) **<u>වෙළඳපොළ ව්‍යුහය සහ හැසිරවීම හඳුනාගැනීම</u>** සංඛ්‍යාත්මක දත්ත එකතුව සහ වෙළඳපොළ තත්ත්වයන් විශ්ලේෂණය කිරීම සිදු කෙරේ.	නිෂ්පාදන 28 කි.
(ඈ) වෙළඳපොළ පර්යේෂණ සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.	06
(ඉ) සාධාරණ තරඟකාරීත්වය සහ වෙළඳ වගකීම් පිළිබඳ දැනුවත් කිරීම	09
(ඊ) තරඟකාරීත්වය අභිවර්ධනය කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් එකම මට්ටමකින් පවත්වාගෙන යාම. 2011 අංක 1505/15 හා 2007/07/11 දිනැති ගැසට් නිවේදනය යටතේ දැනට හඳුනාගෙන ඇති නිෂපාදනයන් 5 පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.	330

2011 වර්ෂය තුළ දී හලාල් කරන ලද ආහාර සහතික කරණය, තීන්ත කර්මාන්තය සහ කෑමට ගන්නා තෙල් වර්ගවල මිල විචලනයන් සම්බන්ධයෙන් අධ්‍යයනයන් පවත්වන ලදී. ඖෂධ වර්ග අලෙවිකරණය සම්බන්ධයෙන් පවතින තරඟකාරීත්වය, වර්තමාන නෛතික සහ පරිපාලන ක්‍රියාපටිපාටි සහ ඖෂධ වර්ග වෙළඳපොළ තුළ පවතින ගැටලු සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කරන ලදී.

සිමෙන්ති, සහල්, එල් පී ගෑස්, තිරිඟු පිටි සහ කිරි පිටි සම්බන්ධයෙන් වෙළඳපොළ සමීක්ෂණ සිදු කරන ලදී. වෙළඳපොළ ඉල්ලුම, කුකුළු මස් සැපයුම් සහ මිල ගණන් සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කරන ලදී. අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල සිල්ලර මිල ගණන් සම්බන්ධයෙන් 2008 වසරේ සිට 2011 වසර දක්වා මිල සංසන්දනයක් සිදු කරන ලදී. ජීවන වියදම සහ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ අමාත්‍ය මණ්ඩල උප කමිටුව වෙතින් අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම සඳහා ආහාර අයිතමයන් 25 ක දෛනික මිල විචලනයන් සම්බන්ධයෙන් වාර්තාවක් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලදී. ව්‍යාපාරික ආයතන සම්බන්ධයෙන් දත්ත පාදකයක් ඇති කිරීමට පියවර ගෙන ඇත.

6. <u>සාධාරණ මිල ගණන් බලපැවැත්වීම සහතික කිරීම</u>

(අ) විශේෂිත භාන්ඩ වල මිල නියාමනය : පනතේ 14, 18, 19 සහ 20 වගන්ති ම ගින් පැවරී ඇති බලතල ප්‍රකාර හඳුනාගත් පාරිභෝගික භාණ්ඩවල වෙළඳපොළ මිල ගණන් සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු අධිකාරිය මැදිහත්ව කටයුතු කරයි. තෝරාගත් පාරිභෝගික භාණ්ඩ වල මිල ස්ථාවර කිරීම / ස්ථායී කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ගෙන ඇති පියවර 8 වන වගුවේ දක්වා ඇත.

පාරිභෝගික ද්‍රව්‍ය	ගනු ලැබූ ක්‍රියාමාර්ග
සිමෙන්ති	සිමෙන්ති සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම සළකා බලමින්, සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති සහ පෝට්ලන්ඩ් හුණුගල් සිමෙන්ති වල දැනට පවත්නා උපරිම සිල්ලර මිල රු.750/- සිට රු.785/- දක්වාත්, පෙදරේරු සිමෙන්ති රු.700/- සිට රු.735/- දක්වා ඉහළ නංවමින් 2011 නොවැම්බර් මස 05 වන දින ගැසට් නිවේදනයක් නිකුත් කොට ඇත.
කුකුලු මස්	සම්පූර්ණ වර්ෂය සඳහා බ්‍රොයිලර් කුකුලු මස් කිලෝ ග්‍රෑම් එකක උපරිම සිල්ලර මිල රු.320/- සිට රු.350/- ලෙස පවත්වාගෙන යාම.
කිරි පිටි	කිරි පිටි සමාගම් විසින් සිදු කරන ලද ඉල්ලීම් සලකා බලමින් පනතේ 20(5) වගන්තිය යටතේ 2011 මැයි මස 02 දිනැති ගැසට් නිවේදනයක් නිකුත් කරමින් සම්පූර්ණ යොදය සහිත කිරි පිටි පැකට්ටුවක මිල පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී. සම්පූර්ණ යොදය සහිත කිරි පිටි ග්‍රෑම් 400 අසුරණයක මිල රු.244/ සිට රු.264/- ක් ලෙසත්, සම්පූර්ණ යොදය සහිත කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක අසුරණයක මිල රු.598/ සිට රු.647/- ක් ලෙසත් ය.
සහල්	සහල්වල උපරිම සිල්ලර මිල දැනට පවතින මට්ටමේම පවතින අතර, ඒ සඳහා මිල සංශෝධනයක් සිදු කර නොමැත.

ද්‍රව පෙට්‍රෝලියම් වායු (LP ගෑස්)

LP ගෑස් වෙළඳපොළ තුළ සිටින ප්‍රධාන සමාගම් 2 සඳහා අවසර ලබා දී ඇති උපරිම සිල්ලර මිල පහතින් සඳහන් වන අතර, 2007 වර්ෂයේ අවසන් භාගය තුළ දී හඳුන්වා දෙනු ලැබූ මිල සූත්‍රය අනුව ඒවායේ මිල ගණන් ගණනය කොට ඇත.

වගුව 9 : 2011 තුළ දී කිලෝ ග්‍රෑම් 12.5, LP ගෑස් සිලින්ඩරයක මිල විචලනය

මාසය	2011	
	ලිට්‍රෝ ගෑස් (රු)	ලාෆ්ස් ගෑස් (රු)
ජනවාරි	1,652	1,556
මාර්තු	1,652	2,029
අප්‍රේල්	1,890	2,029
මැයි	1,890	1,947
ජූලි	1,890	2,050
අගෝස්තු	2,046	2,050
දෙසැම්බර්	2,046	2,046

2011 වර්ෂය තුළ දී කිලෝ ග්‍රෑම් 12.5, LP ගෑස් සිලින්ඩරයක සිල්ලර මිල (කොළඹ)





7. ආයතනික හැකියාවන් පුළුල් කිරීම

(අ) සේවක මණ්ඩල සංවර්ධනය

අපගේ සේවාවන් වඩාත් හොඳ ගුණාත්වයකින් යුක්තව වැඩිදියුණු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අපගේ සේවක මණ්ඩලය සංවර්ධනය කිරීම ඵලදායී ආයෝජනයක් ලෙස සලකා බැලේ. 2011 වර්ෂය තුළ දී සේවක මණ්ඩලය පුහුණු කිරීම සම්බන්ධ තොරතුරු 10 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

<u>වගුව 10 : 2011 වර්ෂය තුළ දී සේවක මණ්ඩල පුහුණු කිරීම</u>

පාඨමාලාව	සහභාගී වූවන් සංඛ්‍යාව	එක් සහභාගී වන්නකු සඳහා පාඨමාලා ගාස්තු	මුළු ආයෝජනය (රු.)
1) අධ්‍යක්ෂවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු සහ සහකාර අධ්‍යෂවරු සඳහා දෙමළ භාෂා පුහුණුව	10	එස්.තිරුනීල කන්දන් මිය විසින් පවත්වන ලදී (අධ්‍යක්ෂකා තරඟකාරීත්ව ප්‍රවර්ධන)	නොමිලේ පවත්වන ලද පාඨමාලාවකි.
2) දිස්ත්‍රික් කාර්යාල විමර්ශන නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු වැඩ සටහන	16		28,000/-
3) ශ්‍රී ලංකා නීතිඥයින්ගේ සංගමය විසින් පවත්වන ලද LAWASIA ව්‍යාපාරික නීතිය පිළිබඳ සම්මන්ත්‍රණය - 2011	04	10000x2 සහ 12500x2	45,000/-
4) E-Wis Career Training (පුද්) සමාගමේ දී පවත්වන ලද Ms Access පුහුණු පාඨමාලාව	25		72,500/-

පාඨමාලාව	සහභාගි වූවන් සංඛ්‍යාව	එක් සහභාගි වන්නකු සඳහා පාඨමාලා ගාස්තු	මුළු ආයෝජනය (රු.)
5) වෛද්‍ය බුද්ධික සෝමවර්ධන මහතා විසින් පවත්වන ලද කාන්තා සෞඛ්‍යය, විශේෂයෙන් ම කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණය.	28		නොමිලේ පත්වන ලදී.
6) ව්‍යාපාර කළමනාකරණය පිළබඳ පශ්චාත් උපාධි ආයතනය මඟින් පවත්වල ලද වෘත්තිකයන් සඳහා වූ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සම්මන්ත්‍රණය.	1	12,500/-	12,500/-
7) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද අන්තර් ජාතික වෙළඳාමේ දී කෘෂිකාර්මික ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් e-learning පාඨමාලාව.	4		නොමිලේ පවත්වන ලදී.
8) ශ්‍රී ලංකා බදුකරණ ආයතනය විසින් පවත්වන ලද බදුකරණයේ ප්‍රායෝගික පිවිසුම් පිළිබඳ විස්තීර්ණ පාඨමාලාව.	2	18,000/-	36,000/-
9) "යහ පාලනය සහ නීතියේ ආධිපත්‍යය හරහා කාර්යසාධනය ඉහළ නැංවීම" යන මැයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) ඒ.එස්.සී. සිල්වා මහතා වෙනුවෙන් පවත්වන ලද වැඩ සටහන.	1	5714.29	5714.29
10) "The Master Orator" සම්මන්ත්‍රණය (C & P අංශයේ විමර්ශන නිලධාරීන් දෙදෙනකු සහ කණිෂ්ඨ නිලධාරියකු සහභාගි විය.)	3	3,500/-	10,500/-
11) ජාතික නීති සම්මන්ත්‍රණය - 2011 අධ්‍යක්ෂ (අනුකූලතා සහ බලගැන්වීම්) සහ පාරිභෝගික කටයුතු සභාවේ ලේකම්වරයා සහභාගි විය.	2	7,500/-	15,000/-
12) ආයෝජනය සඳහා අවස්ථාවක් වන තාක්ෂණ වෙළඳපොළ පිළිබඳ පාඨමාලාව, විමර්ශන නිලධාරීන් තිදෙනෙකු සහභාගි විය.	3		නොමිලයේ පවත්වන ලදී.

පාඨමාලාව	සහභාගි වූවන් සංඛ්‍යාව	එක් සහභාගි වන්නකු සඳහා පාඨමාලා ගාස්තු	මුළු ආයෝජනය (රු.)
13) Training joomla content management tool for Government officers. කළමනාකරණ සහකාර පී.බී.සී.බී. නාරංගොඩ මහතා සහභාගි විය.	1		නොමිලයේ පවත්වන ලදී.
14) ලිපිකරු නිපුණතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (දින 04) (ජේ.ජී.ආර්.ඩබ්ලිව්. අබේරත්න මහතා, මූල්‍ය අංශයේ සරජ් මේ සඳහා සහභාගි වී ඇත.)	1	12,000/-	12,000/-
15) විනය කළමනාකරණය හරහා මානව සම්පත් සංවර්ධනය, අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන) මෙම වැඩ සටහන සඳහා සහභාගි විය.	1	7,500/-	7,500/-

(ආ) අධිකාරියේ කාර්යමණ්ඩල ශක්තිමත් කිරීම සඳහා 2011.05.19 දින පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.

වගුව 11 : 2011 .12.31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩලය

වැටුප් කාණ්ඩය	තනතුර	2011.03.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව	2011.12.31 දිනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
	ජ්‍යෙෂ්ඨ කළමනාකරු			
එච් එම් 2	අධ්‍යක්ෂ ජෙනරාල්	1	0	1
එච් එම් 1-1	අධ්‍යක්ෂ	6	5	1
	* ලේකම් -පාරිභෝගික කටයුතු සභාව	0	1	1
	කළමනාකරු			
	නියෝජ්‍ය අධ්‍යක්ෂ }	16	3	9
	සහකාර අධ්‍යක්ෂ		4	
	කණිෂ්ඨ කළමනාකරු			
ජේ එම් 1-1	විගණන නිලධාරී	2	0	2
	පද්ධති පාලක	1	0	1
	ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී	2	0	2
	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී	1	0	1
	වෙළඳපොල සම්පත් පිළිබඳ ජ්‍යෙෂ්ඨ විශ්ලේෂක	1	1	0
	ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී	2	2	0
	පුද්ගලික ලේකම් (අධ්‍යක්ෂ ජෙනරාල්)	1	0	1
	පුද්ගලික ලේකම් (සභාපති)	1	0	1
	ජ්‍යෙෂ්ඨ පරිපාලන / මානව සම්පත් නිලධාරී	1	0	1
	ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීමේ නිලධාරී	2	1	1
	ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී	1	1	0
	ජ්‍යෙෂ්ඨ පාරිභෝගික බලගැන්වීමේ නිලධාරී	2	0	2
	බලගැන්වීම / මෙහෙයුම් / දූරකථන දිගුව			
එම් ඒ 5-2	දත්ත සම්බන්ධීකාරක	1	0	1
	සංඛ්‍යාලේඛන නිලධාරී	1	0	1
	වෙළඳපොළ සම්පත් විශ්ලේෂක	1	0	1
	ප්‍රලේඛන නිලධාරී	6	0	6
	පුස්තකාලයාධිපති	1	0	1
	පිරිවැය නිලධාරී	15	1	10
	ගිණුම් නිලධාරී		4	
	පරිපාලන නිලධාරී	5	1	4
	නීති හා බලගැන්වීමේ නිලධාරී	3	1	2
	විමර්ශන නිලධාරී	200	149	51
	කළමනාකරණ සහකාර (තාක්ෂණික)			
එම් ඒ 2-2	පොත් තබන්නා	1	0	1

	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)			
එම් ඒ 1-2	කළමනාකරන සහකාර	31	25	6
වැටුප් කාණ්ඩය	**තනතුර**	**2011.03.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව**	**2011.12.31 දිනට සිටින සේවක සංඛ්‍යාව**	**පුරප්පාඩු සංඛ්‍යාව**
	ප්‍රාථමික මට්ටම (පුහුණු)			
පී එල් 3	රියදුරු	12	11	1
	ප්‍රාථමික මට්ටම (නුපුහුණු)			
පී එල් 1	කාර්යාල සහායක	14	12	2
	එකතුව	**331**	**222**	**109**

ස්ථිර සෙවකයන් සංඛ්‍යාව 222

* කොන්ත්‍රාත් පදනම මත / අනියම් පදනම මත / දෛනිකව ගෙවීමේ පදනම මත 14

දැනට පාරිභෝගික කටයුතු අධිකාරියේ සිටින මුළු සේවක සංඛ්‍යාව } 236

2011.12.31 දිනට පාරිභෝගික කටයුතු අධිකාරියේ කොන්ත්‍රාත් පදනම මත / අනියම් පදනම මත සහ දෛනිකව ගෙවීමේ පදනම මත සේවය කරන කාර්ය මණ්ඩල

තනතුර	**පත්වීම් සංඛ්‍යාව**	**කොන්ත්‍රාත්/දෛනිකව ගෙවීමේ පදනම මත**
කණිෂ්ඨ විධායක	1	කොන්ත්‍රාත් පදනම මත
කළමනාකාර සහකාර	7	කොන්ත්‍රාත් පදනම මත
රියදුරු	2	කොන්ත්‍රාත් පදනම මත
කාර්යාල සහායක	2	දෛනිකව ගෙවීමේ පදනම මත
	2	කොන්ත්‍රාත් පදනම මත
එකතුව	14 ===	

(ඇ) **සේවක මණ්ඩල සුභ සාධනය**

වර්ෂය තුළදී සේවක මණ්ඩලයේ ඵලදායිතාව නංවාලීම සඳහා දායකත්වය ලබාදිය හැකි වන පරිදි ප්‍රසන්න සහ හිතකර වැඩ පරිසරයක් ලබාදීම සඳහා විවිධ පහසුකම් සැපයීමට පියවර ගන්නා ලදී. කාර්යාල පරිශ්‍රය ඉදිරිපස වෙසක් කූඩුවක් සකස් කිරීම සඳහා කාර්යාල මණ්ඩලය දායක වූ අතර, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන ද වෙසක් කූඩු සකසා අදාළ පරිශ්‍රය සැරසීමට කටයුතු කරන ලදී. අමාත්‍යාංශය විසින් පවත්වන ලද තරඟයේ දී අපගේ කාර්ය මණ්ඩලය විසින් සකස් කරන ලද වෙසක් නිර්මාණයට දෙවන ස්ථානය හිමි විය.

අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනවල කාර්ය මණ්ඩල සඳහා අමාත්‍යාංශය මගින් සංවිධානය කළ දැල් පන්දු සහ ක්‍රිකට් තරඟාවලිය සඳහා පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්ය මණ්ඩලය සහභාගි විය.

(ඇ) <u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි සංශෝධන</u>

පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ සංශෝධන කඩිනම් කිරීම සඳහා අධිකාරිය, නීතිපති දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්ය සාධනය</u>

පාරිභෝගික කටයුතු සභාව, පාරිභෝගික කටයුතු අධිකාරිය යටතේ පාලනය වන අතර, අධිකාරිය විසින් සභාව වෙත එවනු ලබන යොමු කිරීම් සහ ප්‍රධාන වශයෙන් ම තරඟ විරෝධී චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් අසා නිශ්චය කිරීම සඳහා පනත මගින් බලය පවරා ඇත. පනතේ විධිවිධාන ප්‍රකාර, අධික මිල ගණන්, වෙළඳපොළ අඩුලුහුඩුකම් සහ වෙළඳපොළ හැසිරවීම් සම්බන්ධයෙන් ද විමර්ශන කටයුතු සඳහා, සභාව වෙත යොමු කෙරේ. අවශ්‍ය අවස්ථාවන්හි දී භාණ්ඩ හා සේවා සැපයිය යුතු ඉහළම මිල ගණන් නිර්දේශ කිරීමට සභාවට බලය ඇත.

2011 වර්ෂය තුළදී, 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ 20(4) වගන්තිය ප්‍රකාර සම්පූර්ණ යොදය සහිත කිරිපිටි සහ සිමෙන්ති සම්බන්ධයෙන් සභාව විසින් අධිකාරිය වෙත ඉහළම මිල ගණන් නිර්දේශ කරන ලදී. ඖෂධ වර්ග සහ පොහොර සම්බන්ධයෙන් මිල කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා සභාව විමර්ශන පවත්වන ලදී.

වර්ෂය තුළදී, සභාව විසින් තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධයෙන් පැමිණිලි 2 ක් විමර්ශනය කළ අතර, එක් විමර්ශනයක කටයුතු අවසන් කරන ලදී. තව ද සභාව විසින් අසාධාරණ වෙළඳ චර්යාවන් සම්බන්ධයෙන් වූ පැමිණිල්ලක් ද මෙහෙය වූ අතර, එය නිරාකරණය කරන ලදී.

පාරිභෝගික කටයුතු අධිකාරිය

2011/12/31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

	2011 000' රු.	2011 000' රු.	2010 000' රු.	2010 000' රු.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ	29,798		29,713	
ආයෝජන (දිගුකාලීන)	74,420		52,992	
සේවක ණය (දිගුකාලීන)	10,392		10,277	
		114,610		92,982
ජංගම වත්කම්				
භාණ්ඩ ලැයිස්තු /තොග	1,168		446	
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	24,695		13,725	
රජයේ ණයගැතියෝ	21,838		21,838	
මුදල් සහ මුදල් සමාන දෑ	23,520		39,448	
		71,221		75,457
මුළු වත්කම්		**185,831**		**168,439**
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවිය යුතු සහ අනෙකුත් වගකීම්	4,608		1,892	
උපචිත වියදම්	17,312		15,704	
		21,920		17,596
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	14,127		11,565	
		14,127		11,565
මුළු වගකීම්		**36,045**		**29,161**
මුළු ශුද්ධ වත්කම්		**149,785**		**139,278**
ශුද්ධ වත්කම්/හිමිකම්				
සමුච්චිත අරමුදල	63,191		63,191	
විලම්භිත ආදායම	35,409		37,520	
සංචිත	51,185		38,567	
		149,785		**139,278**
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		**149,785**		**139,278**

....
අධ්‍යක්ෂ / මූල්‍ය
පාරිභෝගික කටයුතු අධිකාරිය

....
අධ්‍යක්ෂ ජනරාල්
පාරිභෝගික කටයුතු අධිකාරිය

....
සභාපති
පාරිභෝගික කටයුතු අධිකාරිය

පාරිභෝගික කටයුතු අධිකාරිය

2011.12.31 දිනට අවසන් වසර සඳහා

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	2011	2010
	000' රු. 000'	000' රු.000'
මෙහෙයුම් ආදායම		
පුනරාවර්තන ප්‍රදාන	161,629	143,029
දඩ මුදල් ආදායම	30,850	9,802
අනෙකුත් ආදායම්	14,807	9,854
	207,286	162,685
මෙහෙයුම් වියදම්		
සේවක පඩිනඩි	108,345	85,944
ගමන් වියදම්	9,230	2,998
සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය	7,598	5,638
නඩත්තු වියදම	3,108	5,774
කොන්ත්‍රාත් ගත සේවා	36,148	18,831
ක්ෂය සඳහා වෙන්කිරීම්	8,060	6,306
අනෙකුත් මෙහෙයුම් වියදම්	22,095	15,411
මුළු මෙහෙයුම් වියදම්	194,585	140,904
මෙහෙයුම් කාර්යන් තුළින් ජනිත වූ අතිරික්තය / (හිඟය)	12,702	21,781
	-	-
මූල්‍ය පිරිවැය	84	57
මෙහෙයුම් නොවන මුළු වියදම්	84	57
අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය (හිඟය)	12,618	21,723
වත්කම් විකිණීමේ ලාභ	-	40
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)	12,618	21,763

පාරිභෝගික කටයුතු අධිකාරිය

2011.12.31 දිනට අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2011	2010
මෙහෙයුම් කාර්යන් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහ	රු. 000' වලින්	රු. 000' වලින්
සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ අතිරික්තය / (හිඟය)	**12,618**	**21,723**
ගැලපුම්		
ක්ෂය කිරීම	8,061	6,306
පාරිතෝෂික ප්‍රතිපාදන ඉහළ යාම	2,562	2,039
ක්‍රමක්ෂය	25	-
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**23,266**	**30,068**
ගෙවිය යුතු මුදල් ඉහළ යාම - සටහන I	4,324	5,406
අනෙකුත් ජංගම වත්කම් ඉහළ යාම - සටහන II	(11,692)	(2,471)
මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**15,898**	**33,003**
ආයෝජන කටයුතු තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
පිරියත හා උපකරණ මිලදී ගැනීම	(8,172)	(4,627)
පිරියත හ ා උපකරණ විකිණීමෙන් ලද මුදල්	-	435
ආයෝජන ඉහළ යාම	(21,428)	(7,105)
දිගුකාලීන ණය ඉහළ ය ාම	(115)	(2,112)
ආයෝජන කටයුතු තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(29,715)**	**(13,409)**
මූල්‍ය කටයුතු තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
විලම්භිත ආදායම	(2,111)	10,794
පාරිභෝගික ආරක්ෂණ අරමුදල	-	-
ප්‍රත්‍යාගණන අතිරික්තය	-	(10,622)
මූල්‍ය කටයුතු තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(2,111)**	**172**
මුදල් හා මුදල් සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ ඉහළ යාම/(පහළ යාම)	(15,928)	19,766
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	39,448	19,682
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**23,520**	**39,448**

ගිණුම් සඳහා සටහන්

1. ඒකාබද්ධ තොරතුරු

1.1 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරණ සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/58/02 ප්‍රකාර නියාමන නියෝජිතායතන අතරින් "A" උප වර්ගීකරණය යටතේ "A" කාණ්ඩයේ වර්ගීකරණය යටතට පාරිභෝගික කටයුතු අධිකාරිය අයත් වේ.

1.2 **මූලික කර්තව්‍යය සහ මෙහෙයුම් ස්වභාවය :** අධිකාරියේ මූලික කර්තව්‍ය වන්නේ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ වෙළඳාම විධිමත් කිරීමයි.

2012 වසර අවසන් වන විට අධිකාරියේ සේවකයින් සංඛ්‍යාව 235 කි.

වැදගත් කොටස් හිමිකාරත්වය / හිමිකම

පාරිභෝගික කටයුතු අධිකාරිය ප්‍රධාන වශයෙන් ම භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදල් මත යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදලක් යෙදවීම මගින් ඇති කරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මගින් ද අධිකාරියේ හිමිකම නිරූපනය කෙරේ.

1.3 අංක REF TO/ISD/3/PE/2005 දිනැති 24.06.2005 භාණ්ඩාගාර ලිපිය අනුව, 2005 වර්ෂය සඳහා රජයේ ණයගැති ගිණුම යටතේ රු.21,837,974.52/- ක ශේෂයක් දක්වා ඇත. පාරිභෝගික කටයුතු අධිකාරිය වෙනුවෙන් රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් මෙම මුදල පාරිභෝගික කටයුතු අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදල වෙත මුදාහරින මෙන් මහා භාණ්ඩාගාරය වෙත සිහිකැඳවීම් කිහිපයක් ම සිදුකර ඇත.

1.4 වත්කම් ආශ්‍රිත රජයේ ප්‍රදාන සහ මූල්‍ය නොවන ප්‍රදාන සාධාරණ වටිනාකම් යටතේ විලම්භිත ආදායම් වශයෙන් ශේෂ පත්‍රයේ දක්වා ඇත.

2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 අනුකූලතා ප්‍රකාශය

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අමතරව, ශේෂ පත්‍රය, ආදායම් හා වියදම් ගිණුම ආශ්‍රිත ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා සටහන් පිළියෙල කිරීමේ දී හැකි සෑම විටක ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත උපයෝගී කොටගෙන ඇත.

2.2 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල්වලන් ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කොට ඇත.

2.3 සංසන්දනාත්මක තොරතුරු

2.3.1 2.4 වගන්තිය යටතේ වැඩිමනත් වශයෙන් විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සම්බන්ධයෙන් හැරුණ විට අධිකාරිය විසින් අවස්ථානුකූලව ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කොට ගෙන ඇත.

2.3.2 2011 වර්ෂයේ දඩ මුදල් ආදායම සඳහා සිදුකළ ගිණුම්කරණ ප්‍රතිකර්ම සම්බන්ධයෙන් 2010 වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු සංශෝධනය කරන ලදී.

2.4 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

2.4.1 උපචිත වියදම්

අදාළ වියදම් ගිණුම් සඳහා උපචිත වියදම් අධි ප්‍රතිපාදන ගැලපුම් කිරීම වෙනුවට, 2011 වර්ෂයේ සිට අධිකාරිය විසින් එම ප්‍රතිපාදන සංචිත (පූර්ව වර්ෂයේ) ගිණුමට ගැලපුම් කොට ඇත.

2.4.2 දඩ මුදල් ආදායම

අධිකාරියේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සඳහා දඩ මුදල් ආදායම උපයෝගී කර නොගත් බැවින් දඩ මුදල් ඉපැයුම් මීට පෙර ආදායම් ප්‍රකාශනවලින් ඉවත් කොට තිබුණි. 2011 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයේ විශේෂ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා උපයෝගී කර ගන්නා ලදී. එම නිසා, 2011 වර්ෂයේ දී දඩ මුදල් ඉපයීම් ආදායමක් වශයෙන් සලකන ලද අතර, දඩ මුදල් ආශ්‍රිත සියලුම වියදම් සහ ආදායම්, ආදායම් සහ වියදම් ගිණුමේ දක්වා ඇත. තව ද අරමුදලේ ශුද්ධ වටිනාකම සටහනක් ආකාරයෙන් වෙනම දක්වා ඇත.

2.4.3 දඩ මුදල් වශයෙන් අධිකාරිය වෙත ආදායම් මාර්ග ලැබෙන අවස්ථා පවතී. පාරිභෝගික කටයුතු අධිකාරියේ අදාළ වැටලීම් නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන නඩු අංක සහ අදාළ අධිකරණය විසින් ලබාදෙන නඩු අංක අතර වෙනස්කම් පවතින බැවින් ඒවා එම අවස්ථාවේ දී ම හඳුනාගත නොහැකි වී ඇත. එම මුදල සත්‍ය වශයෙන් අධිකාරිය වෙත හිමි ද එසේ නැතහොත් වැරදීමකින් අධිකරණ මඟින් ප්‍රේෂණය කර ඇද්ද යන්න නිශ්චිත වශයෙන් ම දැනගැනීම පිණිස එම මුදල් සාමාන්‍යයෙන් දඩ මුදල් අවිනිශ්චිත ගිණුම වෙත මාරු කරනු ලැබේ. වසරක් පමණ යනතුරු එම මුදල් හඳුනාගත නොහැකිව එපරිදි ම පවතී නම් එකී මුදල් අධිකාරියේ, පාරිභෝගික ආරක්ෂණ අරමුදල වෙත බැර කෙරෙනු ඇත.

2.5 මූල්‍ය වර්ෂය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය අධිකාරියේ මූල්‍ය වර්ෂය ලෙස සලකනු ලැබේ.

3. වත්කම්වල පදනම සහ ඒවායේ අගය තක්සේරු කිරීම

3.1 දේපළ යන්ත්‍රාගාර සහ උපකරණ

3.1.1 දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ, සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුව පිරිවැය මත ගිණුම්ගත කොට ඇත.

3.1.2 දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණවල පිරිවැය යන්නෙන් මිලදී ගත් පිරිවැය හෝ එහි අපේක්ෂිත පරිහරණය, සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා දරණ ලද යම් වියදමක් ද ඇතුළුව ඉදිකිරීම් පිරිවැය අදහස් වේ.

3.1.3 ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යාමේ අරමුණින් ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම, වැඩිදියුණු කිරීම සඳහා දරණ වියදම් හෝ එකී වත්කම්වල ජීව කාලය ඉහළ නැංවීම සඳහා දරණ ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබ ඇත.

3.1.4 අයවැය චක්‍රලේඛ අංක 150 ප්‍රකාර, 2012 වර්ෂය ආරම්භයේ දී පාරිභෝගික කටයුතු අධිකාරියේ වාහන සංචිතය වෙත වාහන 05 ක් (ටොයොටා හයිඒස් වෑන් 04 ක් සහ ටොයොටා කාර් එකක්) සපයන ලදී.

3.2 ක්ෂය වෙන් කිරීම

2010 ජනවාරි මස 01 දින සිට අත්පත් කරගත් සියලුම වත්කම් අධිකාරියේ භාවිතයට යොදාගත් දිනෙනේ ආරම්භ වන මාසයේ සිට ක්ෂය ප්‍රතිපාදන සලසනු ලබයි.

3.2.1 දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ ඒවායේ ඇස්තමේන්තු ගත ආයු කාලය මත පිරිවැය කපා හැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට සංසන්දනාත්මක පදනම මත ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත.

3.2.2 ක්ෂය ප්‍රතිපාදන ගණනය කිරීමේ දී පාරිභෝගික කටයුතු අධිකාරිය, සරල මාර්ග ක්‍රමය භාවිතා කරනු ලබයි.

3.2.3 පුස්තකාල පොත් සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොමැත.

3.2.4 වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන විලම්භිත ආදායම් ගිණුමට මාරු කෙරේ.

3.3 **<u>ගොඩනැගිලි පරිශ්‍රය - කුරුණෑගල</u>**

කරුණෑගල දිස්ත්‍රික ලේකම් විසින් පාරිභෝගික කටයුතු අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැගිලි පරිශ්‍රය සඳහා ගෙවන ලද රුපියල් මිලියනයක මුදල වර්ෂ 40 ක කාලය සඳහා ක්‍රමක්ෂය කර ඇත.

3.4 **<u>ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල්</u>**

ප්‍රත්‍යාගණනය සඳහා ඇස්තමේන්තු කර ඇති වටිනාකම් මත ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් සඳහන් කොට ඇත.

3.5 භාණ්ඩ ලැයිස්තු අවම පිරිවැය මත හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම මත අගය කර ඇත.

3.6 **<u>මුදල් සහ මුදල් සමාන දෑ</u>**

මුදල් සහ මුදල් සමාන දෑ, අතේ ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ කෙටිකාලීන ආයෝජන වශයෙන් අර්ථ නිරූපනය කොට ඇත.

3.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් හා බැංකු තැන්පතු ඇතුළත් වේ.

4. **<u>වගකීම් සහ ප්‍රතිපාදන</u>**

4.1 **<u>ගෙවිය යුතු මුදල්</u>**

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කොට ඇත.

4.2 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

4.2.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකය

පාරිතෝෂිකය වනාහී නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ව්‍යවස්ථාවට අනුකූලව අධිකාරිය පාරිතෝෂික ගෙවීමට බැදී සිටී. මෙම වගකීම සපුරාලීම සඳහා සේවා කාලයේ පළමු වර්ෂයේ සිට ආරම්භ වී සේවය සපයනු ලබන සෑම වර්ෂයක් ම සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මස සියලුම සේවකයන්ගේ මාසික වැටුප මත ගණනය කරලු ලබන මුදලට සමාන මුදලක්, ශේෂ පත්‍රය යටතේ ප්‍රතිපාදනයක් ලෙස ඉදිරියට ගෙන එනු ලබයි. වර්ෂය ආරම්භයේ දී ඉදිරියට ගෙනා ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේ දී පහළට ගෙන ආ ශේෂය අතර වෙනසක් පැවතියේ නම් එය ආදායම් ප්‍රකාශය මඟින් නිරවුල් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාර, අවම වශයෙන් වර්ෂයක් සම්පූර්ණ කර ඇත සේවකයන් සඳහා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. මහා භාණ්ඩාගාරය විසින් කලින් අරමුදල් මුදා නොහරින බැවින් පාරිභෝගික සැලසුම් සම්බන්ධයෙන් කිසඳු මුදලක් අධිකාරිය මඟින් ආයෝජනය කොට නොමැත.

4.2.2 නිශ්චිත දායක මුදල් සැලසුම්/සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවකයින් ආවරණය කරනු ලබන ආර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල සඳහා ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් වශයෙන් පෙන්වා දී ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා පිළිවෙලින් අධිකාරිය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% ක දායක මුදලක් ගෙවනු ලැබේ.

4.3 අසම්භාව්‍ය වගකීම්

බේරුම් කිරීම - සී/ස. ෂෙල් ගෑස් (පුද්) සමාගම

4.3.1 සී/ස. ෂෙල් ගෑස් (පුද්) සමාගම රජය විසින් පවරාගෙන ඇති අතර, එහ නම සී/ස. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම වශයෙන් වෙනස් කොට ඇත. එම නිසා සමාගමේ ව්‍යුහය රාජ්‍ය ආයතනයක් බවට පත් වී ඇත. ලිට්‍රෝ ගෑස් සමාගම විසින් ඔවුන්ගේ උපදේශක වෙත දන්වා ඇති පරිදි ඔවුන් බේරුම් කිරීමේ ක්‍රියාදාමයකට අවතීරණ නොවී අදාළ ගැටලුව නිරාකරණය කොට ඇත. මේ සම්බනධයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනය 2011 වර්ෂය සඳහා විවිධ ආදායම් ගිණුමට මාරු කරන ලදී.

4.3.2 රු.66,913.10/- ක් වටිනා භාණ්ඩ තොග නැතිවීම සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වෙන අතර, 2011/12/31 දින වන විට එම කාරණය නිරාකරණය කර නොතිබුණි.

5. **<u>ආදායම</u>**

දඩ මුදල් ආදායම උපචිත පදනම මත හඳුන්වා ඇත.

6. පුද්ගලික කාරණා හැරුණු විට ප්‍රතිපත්තියක් වශයෙන් වටිනාකම රු.1,000/- ට වැඩි අයිතමයන් හෝ වසරකට වැඩි කාලයක් පාවිච්චි කළ හැකි අයිතිමයන් ප්‍රාග්ධනිත කර ඇත. අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් පවරා ගත් අයිතිමයන් හැර ස්ථාවර වත්කම් ආදිය ආනයනය බදු අනෙකුත් සෘජු පිරිවැය ඇතුළත්ව ඒවායේ මිලදී ගත් වටිනාකම මත අගය කොට ඇත.

7. වර්ෂය සඳහා භාණ්ඩාගාරය මගින් පූර්ණ වශයෙන් මුදාහරිනු ලබන ප්‍රාග්ධන අරමුදල්වල මූල්‍ය වටිනාකම වර්ෂයේ අවසන් දිනට පූර්ණ වශයෙන් උපයෝගී කරගෙන ඇති අතර, එය සමුච්චිත අරමුදල් යටතේ ප්‍රාග්ධන සංචිත වශයෙන් පෙන්වා දී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No } පීසී/ඊ/සීඑච්/එෆ්එ/2011	ඔබේ අංකය / உமது இல / Your No }	දිනය / திகதி / Date } 2013 ජනවාරි 28 දින.

සභාපති,

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය 2003 අංක 09 දරන පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2012 සැප්තැම්බර් 20 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතතාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගනනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ට අනුව, වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන, ආදායම් ප්‍රවේශයට ගිණුම් තැබීමේදී විලම්භිත ආදායම් ගිණුමේ ශේෂය රජයේ ප්‍රදාන මගින් මිලදී ගනු ලැබූ වත්කම්වල ශුද්ධ අගයට සමාන විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ විලම්භිත ආදායම රු.35,351,536 ක් වුවද, වත්කම් වල ශුද්ධ අගය රු. 28,742,326 ක් වූයෙන් රු.6,609,210 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අධිකාරිය විසින් 2012 පෙබරවාරි 28 දින කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර විගණනය විසින් පෙන්වා දෙනු ලැබූ රු.6,410,195 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු ගැලපීමෙන් පසුව 2012 අගෝස්තු 20 දින අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන නැවත සකස්කර ඉදිරිපත් කරන ලදී. එහෙයින් එවැනිම ගිණුම්කරණ අඩුපාඩු තවදුරටත් නොතිබේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

2.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත	
(i) 3(1) වගන්තිය	අධිකාරියේ සාමාජිකයන් අදාල ක්ෂේත්‍රයන්හි පිළිගත් සුදුසුකම්, පළපුරුද්ද හා විශිෂ්ඨත්වයක් ලබා ගත්තවුන් විය යුතු වුවද, 2011 වර්ෂයේදී අදාල සුදුසුකම් සපුරා නොමැති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී තිබුණි.
(ii) 27 වගන්තිය	මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන රු.100,000 ක් නොඉක්මවූ වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දෙකුම අධිකාරියේ ලියාපදිංචි විය යුතු වුවද, මේ දක්වා කිසිදු වෙළෙන්දෙකු ලියාපදිංචි කිරීමට අධිකාරිය ක්‍රියා කර නොතිබුණි.
(ආ) 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 4(2) වගන්තියේ අතුරු විධිවිධානය	2012 ජනවාරි 17 දින ගෙවා තිබුණු 2010 වර්ෂයේ ඉතිරි වෛද්‍ය නිවාඩු (leave encashment) වෙනුවෙන් පනතේ විධිවිධාන ප්‍රකාර බදු වගු අංක 02 අනුව ගණනය කරන ලද උපයන විට බදු අයකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මු.රෙ.133 හා 134	නව විගණන වැඩ සටහන් පිළියෙල කිරීම හා අදාල විගණන කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යෙදවීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම විය යුතු වුවද, අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණක හැරුණු විට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබුණි.
(ii) මු.රෙ.371 (2) (ආ)	අතුරු අග්‍රිමයක් දිය යුත්තේ එක් අවස්ථාවකදී රු.20,000 ක උපරිමයකට යටත්ව විය යුතු වුවද, රෙගුලාසියට පටහැනිව එම සීමාව ඉක්මවා 2011 වර්ෂය තුළදී අවස්ථා 40 කදී එකතුව රු.2,940,800 ක අතුරු අග්‍රිම ලබා දී තිබුණි.
(iii) මු.රෙ. 371 (5)	නිකුත් කරන ලද අතුරු අග්‍රිමයක් ආපසු භාරදීම, මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පෙර සිදු කල යුතු වුවද, එදිනට එකතුව රු.852,600 ක අතුරු අග්‍රිම පියවා නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 8.3.4 ඡේදය හා 2010 සැප්තැම්බර් 01 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/05/(VIII) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	නිලධාරීන් සිය රාජකාරි ඉටු කිරීමේදී භාවිතා කරනු ලබන දුරකථන හා අන්තර්ජාල පහසුකම් සම්බන්ධයෙන් මාසික උපරිම ඒකාබද්ධ වියදම් සීමාවක් අනුගමනය කළ යුතු වුවද, අධිකාරියේ නිලධාරීන් 06 දෙනෙකුට එකී සීමා ඉක්මවා වියදම් දැරීම සඳහා ඉඩදී තිබුණි.

(ii) 8.3.5 (ඇ) ඡේදය හා 1999 ඔක්තෝබර් 01 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	"ඩී" කාණ්ඩයට අයත් ආයතනවල වෙන් කළ වාහන සඳහා හිමිකම් ඇත්තේ සභාපතිට, ප්‍රධාන විධායක නිලධාරියාට හා විධායක අධ්‍යක්ෂවරුන්ට පමණක් වුවද, චක්‍රලේඛ නියෝගයන්ට පටහැනිව චක්‍රලේඛයෙන් ආවරණය නොවන අධිකාරියේ අධ්‍යක්ෂවරු හතර දෙනෙකුට හා පාර්ලෞකික සභාවේ ලේකම්වරයාට රු.43,000 ක සහ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂකවරුන්ට රු.7,500 ක මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද මුළු ප්‍රවාහන දීමනාව රු. 3,025,500 ක් විය.
(iii) 9:3:1 ඡේදය	නියමිත නොවන කාලපරිච්ඡේද සඳහා වැඩ බැලීම් පත්වීම් මගින් පුරප්පාඩු තනතුරු නොපිරවිය යුතු වුවද, චක්‍රලේඛ නියෝග වලට පටහැනිව අධිකාරියේ නිලධාරීන් 8 දෙනෙකු මාස 3 සිට 22 දක්වා කාලයක් තුළ වැඩ බැලීම්/ රාජකාරි ආවරණය කිරීම් සඳහා පත්කර තිබුණි.
(iv) 9.2 හා 9.3.1(i) ඡේද සහ 2010 පෙබරවාරි 08 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/41/5/255/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය	සෑම ආයතනයක් සඳහාම රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අනුමත කරගත් බඳවා ගැනීම් පරිපාටියක් තිබිය යුතු වුවද, විධිමත් අනුමත බඳවා ගැනීම් පරිපාටියකින් තොරව අධිකාරිය බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කර තිබුණි.
(v) 9.10 ඡේදය	භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත කොන්ත්‍රාත්, අනියම් හා අනෙකුත් බඳවා ගැනීම් සිදු කළ යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 20 දෙනෙකු සේවයේ යොදවා වැටුප් හා දීමනා ලෙස රු. 4,720,678 ක් ගෙවා තිබුණි.

(ඉ)	2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය හා 2003 මාර්තු 28 දිනැති අංක එම්එෆ්/ටීආර්/1/2003 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලිපිය	කුලී වාහන පාවිච්චි කරන රජයේ ආයතන ප්‍රමුඛතාවය මත මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගත යුතු වුවද, චක්‍රලේඛයට පටහැනිව අධිකාරිය කුලී පදනම මත වාහන ලබා ගෙන තිබුණු අතර 2011 වර්ෂයේ වාහන කුලී ලෙස රු.14,692,581 ක් ගෙවා තිබුණි. 2010 වර්ෂයට සාපේක්ෂව එය 538% ක වැඩිවීමක් විය.
(ඊ)	2010 සැප්තැම්බර් 20 දිනැති අංක සීඑච්/එච්ආර්/74/2010 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව	නව සන්නිවේදන ජාලයක් ලෙස ඩයලොග් දුරකථන හඳුන්වා දීම මගින් අධිකාරියේ මාසික දුරකථන බිල්පත් 30% කින් අඩු කිරීමට අපේක්ෂා කර තිබුණද, 2010 වර්ෂයේදී රු.1,243,003 ක් වූ දුරකථන වියදම, සමාලෝචිත වර්ෂයේදී රු.2,289,205 ක් වූයෙන් 2010 වර්ෂයට සාපේක්ෂව රු.1,046,202 කින් එනම් 84% කින් වැඩි වී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.12,618,138 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.21,763,716 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,145,578 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. පුද්ගල පඩිනඩි, ගිවිසුම්ගත සේවා හා වෙනත් මෙහෙයුම් වියදම් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, අධිකාරියේ ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.140,960,486 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු.194,667,564 ක් වීම හේතුවෙන් රු.53,707,078 ක එනම් 38.1% ක වියදම් වල වැඩිවීමක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 39 වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවා ඇති අතර ,එම පනතේ 41 (3) වගන්තියට අනුව, අවස්ථාවෝචිත පරිදි පනතේ 37 හෝ 38 වගන්ති යටතේ සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක දී එම ඉල්ලීම ලැබීමෙන් මාසයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබීම සභාවේ කාර්යය විය යුතු වුවද, ඊට පටහැනිව 2010 වර්ෂයේ ලද ඉල්ලීම් සම්බන්ධව 2011 වර්ෂයේ දී ක්‍රියා කළ බවත් 2011 වර්ෂයේ එක් ඉල්ලීමක් පමණක් ලද බවත් විගණනයට දන්වා තිබුණු අතර 2011 වර්ෂය සඳහා සභාව වෙනුවෙන් දරා ඇති වියදම රු.2,464,925 ක් විය.

(ආ) 2011 ඔක්තෝබර් 17 දිනැති අංක 1728/5 දරන ගැසට් නිවේදනය මගින් නම් කරන ලද භාණ්ඩ වර්ග 37 ක් සම්බන්ධයෙන් ප්ලාස්ටික්, ඝන කඩදාසි හෝ දැව වලින් සකසා ඇති ඇසුරුම් භාවිතා කළ යුතු බවට කරන ලද නියෝගය 2012 ජනවාරි 13 දිනැති 1740/22 දරන ගැසට් නිවේදනය මගින් භාණ්ඩ වර්ග 21 ක් දක්වා අඩු කරන ලදී. මෙම කටයුත්ත සඳහා අධිකාරිය හා අමාත්‍යාංශය පිළිවෙලින් රු. 673,348 ක් හා රු.18,017,340 ක වියදම් දරා තිබුණි. පසු විපරම් කටයුතු සඳහා දරන ලද වියදමට සරිලන ප්‍රතිලාභයන් ලැබී තිබුණු බවට සාක්ෂි නොවිණි.

(ඇ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 8 (ඇ), (ඌ) හා (එ) සිට (ඕ) දක්වා වූ වගන්ති ප්‍රකාරව අධිකාරියේ කර්තව්‍යයන් ලෙස පාරිභෝගිකයින් දැනුවත් කිරීම, මහජනතාවට තොරතුරු සැපයීම හා පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම යනාදී කටයුතු ඉටු කළ යුතු වුවද, 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දිස්ත්‍රික් කාර්යාලවලින් පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, එම කර්තව්‍යයන් ඉටු කිරීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

දිස්ත්‍රික්කය	පාරිභෝගික සංවිධාන පිහිටුවීම	පාරිභෝගික අධ්‍යාපන සංවිධාන පැවැත්වීම
කළුතර	නැත	01
හම්බන්තොට	නැත	නැත
වවුනියාව	නැත	නැත
මොණරාගල	නැත	08
අම්පාර	නැත	03
මහනුවර	නැත	02
පුත්තලම	04	නැත
ගම්පහ	03	නැත

4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ රාජ්‍ය ණයගැතියන් ලෙස දක්වා තිබුණු රු.21,837,975 ක් වූ පාරිභෝගික ආරක්ෂණ අරමුදල් ගිණුමේ ශේෂය 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අක්‍රීය ගිණුමක් ලෙස භාණ්ඩාගාරයේ පැවතුණු අතර 2012 අගෝස්තු වන විට එම මුදල් ආපසු ලබාගෙන අරමුදල පිහිටවූ අරමුණු වලට පටහැනිව කුලී වාහන සඳහා වැය කර තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අධිකාරිය විසින් ඉතිරිකරගත් වෛද්‍ය නිවාඩු දින 21 ක් සඳහා ගෙවීම් කිරීමේ යෝජනා ක්‍රමයක් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද ඊට පටහැනිව 2005 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය තුළ ඉතිරිකරගත් වාර්ෂික නිවාඩු දින 7 ක් සඳහාද එකතුව රු.3,268,187 ක් ගෙවා තිබුණි.

4.4 වෙනත් රජයේ ආයතන වලට ලබා දුන් අධිකාරියේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යාංශයේ සේවයේ නියුක්ත නිලධාරිනියකගේ හා අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම්වරයාගේ 2010 සහ 2011 වර්ෂ වෙනුවෙන් වූ පිළිවෙලින් රු.314,000 හා රු.180,000 ක දුරකථන බිල්පත් හා වැටුප් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.

(ආ) අමාත්‍යාංශයට අයත් ඩිෆෙන්ඩර් රථයක අලුත්වැඩියා හා සේවාකිරීම් වෙනුවෙන් රු.3,361,475 ක් අධිකාරියේ අරමුදලින් දරා තිබූ අතර මෙම වියදම ප්‍රතිපූර්ණය කිරීම අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 හා 2011 වර්ෂවලට අදාලව අධිකාරියේ සේවක සංඛ්‍යාව, එක සේවක සාමාන්‍ය පිරිවැය යනාදී තොරතුරු විගණනයට ඉල්ලා සිටියද, 2013 ජනවාරි 09 දින තෙක්ම එම තොරතුරු ඉදිරිපත් නොකරන ලදී.

(ආ) විධිමත් අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොමැතිව, සමාලෝචිත වර්ෂය තුලදී සේවකයන් 89 දෙනෙකු අළුතින් බඳවා ගෙන තිබුණි.

(ඇ) අධිකාරියේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් හා පලපුරුද්ද නොමැති අයදුම්කරුවකු 2008 පෙබරවාරි 15 දින අධ්‍යක්ෂ මූල්‍ය තනතුරට බඳවා ගෙන තිබුණි. එසේ තිබියදීත් එම අයදුම්කරු අදාල ආරම්භක වැටුප් පියවරේ නොතබා වැටුප් වර්ධක 02 ක් ඉදිරියෙන් තැබීම හේතුවෙන් 2008 පෙබරවාරි 15 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා රු.101,200 ක් වැඩිපුර වැටුප් ගෙවා තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

අධිකාරිය විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම වසර 03 කට නොඅඩු නිශ්චිත කාලයක් සඳහා පිළියෙල කරන ලද්දක් නොවූ අතර එය වසරින් වසර ඉදිරියට ගෙන යමින් තිබූ ලේඛනයක් පමණක්වීම හේතුවෙන් යම් කාලපරිච්ඡේදයක් තුළ අධිකාරිය විසින් ළඟා කර ගතයුතුව තිබූ අරමුණු/ ඉලක්ක නිශ්චිතව හඳුනා ගැනීම ගැටළු සහගත වී තිබුණි.

5.2 ක්‍රියාකාර සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාර සැලැස්ම තුලින් අදාල කාලපරිච්ඡේදය තුළදී ළඟා කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් පැහැදිලිව හඳුනා ගත හැකි විය යුතු වුවද, අධිකාරිය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාර සැලැස්මේ පැවති අඩුපාඩු හා අපැහැදිලිතා හේතුවෙන් ඒ මගින් අපේක්ෂිත අරමුණු ඉටු වේද යන්න පිළිබඳ තහවුරු කර ගත නොහැකි විය.

(ආ) ක්‍රියාකාර සැලැස්මේ 5.4.a 5.4.b හා 5.4.c , අයිතම අනුව, කාර්යසාධන හා අනෙකුත් පුහුණු අවස්ථා හඳුනා ගැනීම, කාර්ය මණ්ඩලය සඳහා සේවක පුහුණු වැඩසටහන් ලබාදීම හා ඇගයීම, තරඟකාරිත්ව ප්‍රවර්ධන අංශයේ වගකීමක් ලෙස පෙන්වා තිබුණද, 2011 වර්ෂයේ ප්‍රගතිය ලෙස දක්වා තිබුණේ පුහුණු වැඩසටහනකට එක් නිලධාරියෙකු සහභාගි කරවීම පමණකි.

(ඇ) එසේම, අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාර සැලැස්මේ ඇතුළත් අයිතම් 8 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණි

5.3 වාර්ෂික වාර්තාව

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සෑම මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 150 ක් තුළ අධිකාරියේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, 2010 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට යොමු කර තිබුණේ 2012 අගෝස්තු 24 දිනදීය.

5.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 නොවැම්බර් 14 හා 15 දෙදින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විධිමත් කල යුතු බවට හා වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ නිලධාරීන් 08 දෙනාගේ තනතුරු මාස 03 ක් ඇතුළත පිරවිය යුතු බවට නියෝගයක් ලබාදී තිබුණද, 2012 දෙසැම්බර් 24 දින වන විටත් අභ්‍යන්තර විගණන ඒකකය විධිමත්ව ස්ථාපිත කිරීමටත් වැඩබැලීමේ පුරප්පාඩු පිරවීමටත් ක්‍රියා කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 22 දිනැති අංක සීඑඑ/එච්ආර්ඒ/109/2010/එම්බී-10-02 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් 2011 වර්ෂයේ උපදේශකවරයෙකු බඳවාගෙන රු.504,000 ක් ගෙවා තිබුණ ද මෙම පත්වීම සඳහා ඉහත දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී දුන් නියෝගය ප්‍රකාර විධිමත් වූ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

5.5 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය තුළ පත්කල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 24 ක් වුව ද ඉන් සාමාජිකයින් තිදෙනෙකු කිසිදු රැස්වීමක් සඳහා සහභාගී වී නොතිබුණි.

(ආ) අනෙකුත් සාමාජිකයන්ගේ රැස්වීම් වලට සහභාගීවීමද යහපත් මට්ටමක නොපැවතුණි. වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් වාර 12 න් වාර 10 ක් සඳහා ඔවුන්ගේ පැමිණීම 50% කට වඩා අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

5.6 අයවැය පාලනය

අධිකාරිය විසින් පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ පැවති පහත සඳහන් අඩුපාඩු හේතුවෙන් අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ප්‍රතිපාදන නොමැතිව අවස්ථා 04 කදී දරනු ලැබූ වියදම රු.22,837,824 ක් වූ අතර අවස්ථා 04 කට අදාල ප්‍රතිපාදිත මුළු මුදල වූ රු.6,730,000 ක් වියදම් නොකර ඉතිරි වී තිබුණි.

(ආ) ඇස්තමේන්තු ගත වියදම ඉක්මවා, වියදම් දරන ලද අයිතම 09 ක් විය. එසේ ඉක්මවා දරා තිබූ වියදම රු.21,783,932 ක් විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) පාරිභෝගික පැමිණිලි පිළිබඳ වාර්තා පවත්වා ගෙනයාම

(ආ) වාහන පාලනය

(ඇ) ස්ථාවර වත්කම්

(ඈ) තොග පාලනය

(ඉ) පිරිස් කළමනාකරණය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාකර විගණකාධිපති වාර්තාව සඳහා සභාපතිවරයාගේ අදහස් දැක්වීම

2.2.1 2003 සහ 2004 වර්ෂවල සාධාරණ වෙළඳ කොමිසමේ සහ අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුවේ වත්කම් හා වගකීම් පවරා ගැනීම විලම්භිත ආදායම් ගිණුම හරහා සිදුකිරීම නිසා එම වත්කම් හා වගකීම්වල තිබූ වෙනස මෙතුළින් නිරූපණය වූ අතර, 2012 වර්ෂයේ අවසන් ගිණුම තුළින් මෙය නිවැරදි කරන ලදී.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල තිබූ සියළු අඩුපාඩු නිවැරදි කර අවසන් ගිණුම විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.

2.2.3 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

(අ) 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත.

(i) **3 (1) වගන්තිය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ ගරු අමාත්‍යතුමන් බැවින්, මේ පිළිබඳව ගරු අමාත්‍යතුමන් දැනුවත් කර සුදුසුකම් නොමැති තැනැත්තන් ලෙස විගණනය විසින් දන්වන ලද පිරිස් ඉවත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්මගින් ගරු අමාත්‍යතුමා වෙත දන්වා යැවීමට අධිකාරිය කටයුතු කර ඇත.

(ii) **27 වගන්තිය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි සංශෝධන සඳහා නීතිපතිවරයාගෙන් අවශ්‍ය අනුමැතිය ලැබීමෙන් පසු මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කිරීම සඳහා ඉදිරි පියවර ගනු ඇත.

(ආ) 2011 අංක 22 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත හා සංශෝධිත 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 4 (2) වගන්තියේ අතුරු විධිවිධාන.

මෙම බදු මුදල් අදාළ නිලධාරීන්ගෙන් අයකර, 2012 වර්ෂයේ දී දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>

(i) **මු.රෙ. 133 හා 134**

අභ්‍යන්තර විගණන තනතුර සඳහා නිලධාරිනියක 2013.03.01 දින සිට පත්කර ඇති අතර, ගිණුම් අංශයට අනුයුක්ත පළපරුදු නිලධාරීන් දෙදෙනෙක් දැනට විගණන අංශයට අනුයුක්ත කර ඇත. තවත් නිලධාරීන් දෙදෙනෙක් ද විගණන අංශය වෙත ස්ථිරව පත් කිරීමට දැනට සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත.

(ii) **මු.රෙ. 371(2)(ආ)**

මෙහි අන්තර්ගතව ඇත්තේ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම, මිල කමිටු රැස්වීම, විගණන කමිටු රැස්වීම හා විශේෂ වැටලීම් ආදිය සඳහා ලබාගත් මුදල් අත්තිකාරම් වේ. මෙම අත්තිකාරම් ලබාගත් කාර්යය නිමවීමත් සමඟ ම එය වියදමක් වන අතර, දිගින් දිගට ම අග්‍රිමයක් ආකාරයෙන් පවත්නා වියදම් නොවේ. ඒ අනුව පවත්නා වියදම් සීමාවන් තුළ මෙම අත්තිකාරම් ලබා දී ඇති බව අධිකාරියේ නිරීක්ෂණයයි. ඉහතින් දක්වන ලද අත්තිකාරම් ලබා දීමේ දී විගණනයේ උපදෙස් අනුව තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කරමි.

මේ වන විට අත්තිකාරම් ලෙස ක්‍රියාත්මක කළ හැකි උපායදූත මුදල් වියදම් සඳහා ප්‍රධාන කාර්යාලයට රු.75,000/- කද, රු. 50,000/- ක් දිස්ත්‍රික් කාර්යාලයට ද වන පරිදි අග්‍රිම සීමාවන්ද වැඩිකර භාණ්ඩාගාරයෙන් අනුමැතිය ද ලබාගෙන ඇත.

(iii) **මු.රෙ. 371(5)**

අධිකාරියේ ක්‍රියාකාරී ස්වභාවය අනුව මෙලෙස අත්තිකාරම් දෙසැම්බර් මස 31 දිනට පෙර පියවීම් අසීරු කාර්යයකි. විශේෂයෙන් කොළඹින් බැහැර දිස්ත්‍රික්කවල දැනුවත් කිරීම්, වෙළඳපොළ වැටලීම් ආදිය සඳහා ලබාගන්නා අත්තිකාකරම් මෙලෙස පියවීම ප්‍රායෝගිකව අසීරු බව පෙන්වා දෙයි. මෙහි සඳහන් අත්තිකාරම් තුළ දෙසැම්බර් 30 දිනට ලබාගත් අත්තිකාරම් ද ඇතුළත් බැවින් මෙහි ඇති ප්‍රායෝගික ස්වභාවය පැහැදිළිව සඳහන් කර ඇත. කෙසේ වෙතත් මෙම තත්ත්වය හැකිතාක් අවම කිරීමට ක්‍රියා කරමි.

(ඈ) <u>2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය</u>

(i) 8.3.4 ඡේදය අංක PF/FS/05/(viii) දරණ හා 2010 සැප්තැම්බර් 01 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය

ඉහත චක්‍රලේඛයන්ට අනුව ආයතන තුනට ගෙවන ලද දුරකථන බිල්පත් නිලධාරීන්ගේ අනුමත සීමාව තුළ අදාළ කරගත් බව සඳහන් කරමි. මෙම රු.2,055,869/- ආයතනයේ ස්ථාවර දුරකථන ද ඇතුළත්ව සම්පූර්ණ වියදම වේ. නිලධාරීන් වෙත අනුයුක්ත කර ඇති දුරකථන සඳහා දරණ ලද වියදම වෙන් වෙන් වශයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.

(iii) අධිකාරියේ විමර්ශන නිලධාරීන්ට හා රියදුරන්ට ද අධිකාරියේ සන්නිවේදන ජාලය යටතේ ඩයලොග් ආයතනය වෙතින් නොමිලේ ලබාගත් දුරකථන සපයා ඇත. ඒ සඳහා බදු මුදල සමඟ එක් දුරකථන අංකයකට අධිකාරිය වැය කරන ලබන්නේ රු.122.45 ක් වන අතර, අධිකාරියේ මෙහෙයුම් කාර්ය භාරයට අදාළ කටයුතු හා සේවාවන් පවත්වාගෙන යාමට මෙම දුරකථන පහසුකම් සැලසීමෙන් මහත් වාසිදායක තත්ත්වයක් උදාවී ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

(ii) **8.3.5.(අ) ඡේදය**

2011 නොවැම්බර් 14 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය "A" ශ්‍රේණියට අයත් ආයතනයක් බැවින් තවදුරටත් මෙම ප්‍රශ්න පැන නොනගින බව සඳහන් කරන ලදී. තව ද, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත ප්‍රවාහන දීමනාව ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක CAA/HRA/66/2010/AOB/06-03 සහ CAA/HRA/47/2012 යටතේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක22/99 පරිදි වූ පොදු ප්‍රවාහන පහසුකම් වෙනුවට වියදම් අවම කිරීම සඳහා අනුමත කරන ලදී. මේ සඳහා විශේෂ අනුමැතියක් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම සඳහා නැවත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

(iii) **9.3.1 ඡේදය**

විගණන විමසුමට අනුව නිලධාරීන් 08 දෙනෙකුගෙ වැඩ බලන හා රාජකාරි ඉටුකර තිබූ නිලධාරීන් සඳහා නව කාර්ය මණ්ඩල අනුමැතියට අනුව ස්ථිර නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා, අයදුම්කරුවන් තෝරාගෙන ඇත. මේ වනවිට තනතුරු දෙකක් සඳහා පමණක් වැඩ බලන හා රාජකාරී ආවරණ කටයුතු සිදු කරයි. එයින් සහකාර අධ්‍යකෂ (Regional) සඳහා ස්ථිර පත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත. අනෙක් තනතුර වන අධ්‍යක්ෂ (මිලකිරීම් හා කළමනාකරණ) තනතුර සඳහා ස්ථිර සුදුසු නිලධාරියෙක් බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවා ඇත.

(iv) මේ අවස්ථාව වන විට පාරිභෝගික කටයුතු අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය සකසා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කොට තිබුණි. අධිකාරියේ රාජකාරි පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියක් ලබාගෙන බඳවා ගැනීම සිදු කරන ලදී.

(v) **9.10 ඡේදය**

ඉහත (iv) පරිදිම ආයතනයේ රාජකාරී අවශ්‍යතාවයන් සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරය මත බඳවා ගෙන ඇත.

(ඉ) <u>2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරණ අයවැය චක්‍රලේඛය හා 2003 මාර්තු 28 දිනැති අංක එම්/එෆ්/ටීආර්/1/2003 දරණ මුදල් හා කුම සම්පාදන අමාත්‍යාංශයේ ලිපිය.</u>

ලංකාව පුරා ඇති ක්‍රියාකාරී පරිපාලන දිස්ත්‍රික් 22 සඳහා සහ ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාත්මක කරනු ලබන වැටලීම්, පාරිභෝගික, වෙළඳ දැනුවත් කිරීම් හා අනෙකුත් පරිපාලන කටයුතු සඳහා පමණක් වාහන (27ක්) අවශ්‍ය වේ. ඒ අනුව අධිකාරිය විසින් 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරණ අයවැය චක්‍රලේඛය පදනම්ව වාහන 25 ක් ඉල්ලා සිටින ලද අතර, මහා භාණ්ඩාගාරය විසින් ප්‍රථම අදියරේ දී වාහන 06 ක් ලබාදී ඇත. ඒ අනුව අධිකාරියේ ඉලක්ක ගත රාජකාරී සාර්ථකව කරගෙන යාම සඳහා අවශ්‍ය අනෙකත හිඟ වාහන කුලී පදනම මත ලබා ගැනීම සිදු කරන ලදී. එය එසේ නොකළේ නම් අධිකාරිය විසින් මේ දක්වා අත්කර ගෙන ඇති ප්‍රගතිය ළඟාකර ගැනීමට නොහැකි වේ. එබැවින් කුලී වාහන ආයතනයේ අවශ්‍යතාවය අනුව ගැනීමට සිදුව අතර, මහා භාණ්ඩාගාරයෙන් ආයතනයට ලැබෙන වාහන ප්‍රමාණය අනුව ඉදිරියේ දී කුලී වාහන ඉවත් කළ හැකි වනු ඇත. අදාළ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සාමාන්‍ය මිල ගණන් යටතේ එම කුලී වාහන යොදවන ලදී.

(ඊ) <u>2010 සැප්තැම්බර් 20 දිනැති අංක සීඒඒ/ඒඑච්/ආර්/74/2010 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව</u>

මෙලෙස 30% ක් අඩුවීමක් බලාපොරොත්තු වූයේ එම අවස්ථාවේ අධිකාරියේ පැවති තත්ත්වය (සේවා තත්ත්වය හ ා සේවක සංඛ්‍යාව) පදනම් කරගෙනය. මේ වන විට අධිකාරියේ කාර්යභාරය පුළුල් කිරීමත්, සේවක සංඛ්‍යාව වැඩි කිරීමත සමඟ ම දූරකථන වියදම වැඩි විය. විශේෂයෙන් ඉලක්ක ගත වැටලීම් හඳුන්වා දීම කාර්ය මණ්ඩල සම්පූර්ණ කිරීම, පාරිභෝගික දැනුවත් කිරීමේ ප්‍රතිඵල මත වැඩි පැමිණිලි ප්‍රමාණයක් මෙහෙයවීම වැනි කරුණු මෙයට බලපා ඇත. එසේ ම ඉහත ක්‍රියාකාරකම් මඟින් දඩ මුදල් ඉපැයීම ද සාපේක්ෂව වැඩි වී ඇති බව අධිකාරියේ නිරීක්ෂණයයි.

2010 වසරට සාපේක්ෂව 2011 වසරේ වැඩි අනුපාතයකින් වියදම ඉහළ යාමට හේතු වූයේ දිස්ත්‍රික් විමර්ශන නිලධාරීන්ගෙන් එක් නිලධාරියකු සඳහා මාසික උපරිම වැටලීම් 06 ක් පමණ වූ ප්‍රමාණයක් වීමත් සහ 2011 වසරේ දී එක් අයෙකුට වැටලීම් 36 දක්වා ප්‍රමාණයක් ලබාදීමත් ප්‍රධාන වශයෙන් ම මෙයට බලපා ඇති හේතු වේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

අධිකාරියේ විෂය පථය තුළ එහි කාර්යභාරය පුළුල් කිරීමත් සමඟ ම පුද්ගල පඩිනඩි, ගිවිසුම් ගත සේවා වශයෙන් මෙහෙයුම් වියදම් හේතුකොටගෙන ඉකුත් වර්ෂයේ රු.140,960,480/- වූ මෙහෙයුම් වියදම් සමාලෝචිත වර්ෂයේ දී රු. 194,607,504/- දක්වා 38.1% කින් ඉහළ ගොස් ඇත. ඒ අනුව 2010 වර්ෂයේ දී රු.21,763,716/- අතිරික්තයක ද 2011 වර්ෂයේ දී රු.12,618,128/- දක්වා අඩු වීමක් ද පෙන්නුම් කරයි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) පනතේ 40 වන වගන්තිය අනුව සභාවේ කර්තව්‍ය වනුයේ "මෙම පනත යටතේ සභාව වෙත යොමු කරනු ලබන සියලුම ඉල්ලීම් / යොමු කිරීම් අසා නිශ්චය කිරීම වේ."

සභාව වෙත ඉල්ලීම් / යොමු කිරීම්, ඉදිරිපත් කිරීමේ අභිමතය ප්‍රධාන වශයෙන් ම පවතින්නේ අධිකාරියට සහ එහි අධ්‍යක්ෂ ජනරාල්වරයාට වේ. (පනතේ 19/(1)/22/(10) සහ 37(1) සහ පනතේ 38 වගන්තිය යටතේ ද, යම් තැනැත්තෙකුට හෝ සංවිධානයකට සෘජුව ම සභාව වෙත ඉල්ලීමක් කළ හැකි බවට සීමිත ප්‍රතිපාදනයක් ඇත.

ඒ අනුව එක් එක් වර්ෂය සඳහා සභාවේ කටයුතු සඳහා ඉලක්කයන් ඉදිරිපත් කිරීමට ප්‍රායෝගිකව සිදු කළ නොහැක.

තව ද යම් විමර්ශනයක් අතරතුර දී යම් පාර්ශ්වයක් කරුණු ඉදිරිපත් කිරීම සඳහා දිනයක් ඉල්ලා සිටින විට නීතියේ ප්‍රතිපාදන අනුව ඔවුන්ට දිනයක් ලබාදිය යුතුය. එබඳු අවස්ථාවල දී පනතේ නියමිත කාලසීමාව තුළ විමසීම අවසන් කර නියෝගය / වාර්තාව සැපයීමට නොහැක.

සභාවේ වියදම ලෙස දක්වා ඇත්තේ සභාවේ සභාපති, සාමාජිකයන් සහ ලේකම් යන නිලධාරීන්ගේ වැටුප් / වේතන / දීමනා / වරප්‍රසාද සහ සභාව පවත්වාගෙන යාම සඳහා වන වියදම් වේ.

මෙම සභාව, ගෙවල් කුලී මණ්ඩලය, ණය සහනදායක මණ්ඩලය සහ විදුලි සංදේශ නියාමන ආයතනය මෙන් වෙළඳ පොළ නියාමනය කිරීම සඳහා පිහිටුවා ඇති නියාමන ආයතනයක් බවට තවදුරටත් සඳහන් කරන අතර, මෙය මුදල් ඉපයීම සඳහා පිහිටුවන ලද ආයතනයක් නොවන බවත්, මෙම සභාවට විමර්ශනය සඳහා ලැබෙන ඉල්ලීම් / යොමු කිරීම් සංඛ්‍යාව සභාවේ පාලනයෙන් බැහැරව පවතින්නක් බවත් වැඩිදුරටත් පෙන්වා දීමට කැමැත්තෙමි.

(ආ) එළවළු හා පලතුරු සඳහා සුදුසු ඇසුරුම් භාවිතය අනිවාර්ය කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් විවිධ පියවර (අදාළ පිරිස දැනුවත් කිරීම සහ වෙළඳපොළ වැටලීම්) ගෙන ඇත. මේ පිළිබඳව අඛණ්ඩව පසු විපරම් වැඩ සටහන් අධිකාරිය විසින් ක්‍රියාත්මක කරයි. නියමිත ඇසුරුම් භාවිතා නොකරන ලද වෙළෙඳුන් 108 දෙනෙකු නීතිය ඉදිරියට පැමිණවීමට මේ දක්වා අධිකාරිය ක්‍රියාත්මක වී ඇත. ඉදිරියේ දී ද මේ පිළිබඳව අඛණ්ඩව වැඩලීම් සිදු කිරීමට සැලසුම් කොට ඇත. එබැවින් අධිකාරිය විසින් මේ සඳහා දරණ ලද වියදම නිශ්ඵල වියදමක් නොවන අතර, ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් එළවළු සහ පලතුරුවල පසු අසවනු හානිය අවම කරමින් එහි ප්‍රතිලාභ ඒ හා සම්බන්ධ සියළු පාර්ශ්වකරුවන් (ගොවීන්, ප්‍රවාහකයින්, පාරිභෝගිකයින්) වෙත ලබාදීමට ආරම්භක පියවර වෙනුවෙන් කරන ලද ආයෝජනයකි.

(ඇ) පාරිභෝගිකයින් දැනුවත් කිරීම, මහජනතාවට තොරතුරු සැපයීම සහ පාරිභෝගික සංවිධාන පිහිටුවීම ආදී කාර්යයන් අධිකාරියේ කර්තව්‍යයක් ලෙස හඳුනාගෙන ඇති අතර, ඒ අනුව එම වැඩ සටහන් ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කර ඇත. සෑම මසක දී ම පැවැත්වෙන දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන වැඩ සටහන්වල දී ද මෙම වැඩ සටහන්වල ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමක් සිදු කරයි. වෙළඳපළ වැටලීම්, උසස් රාජකාරි යන කාර්යයන්ට අමතරව මෙම කාර්යයන් ඉටුකරනු ලැබුවේ දිස්ත්‍රික්ක මට්ටමින් අනුයුක්ත කර ඇති (වැටලීම්) විමර්ශන නිලධාරීන් සීමිත සංඛ්‍යාවක් මඟිනි. මේවන විට නව විමර්ශන නිලධාරීන් බඳවා ගෙන ඇති බැවින් සෑම දිස්ත්‍රික්කයකට ම එක විමර්ශන නිලධාරියකු මෙම දැනුවත් කිරීම සඳහා අනුයුක්ත කරමින් දැනුවත් කිරීම්, පාරිභෝගික සංවිධාන පිහිටුවීම ද වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙයට අමතරව අමාත්‍යාංශය වෙත බඳවාගෙන පාරිභෝගික අධිකාරිය වෙතට අනුයුක්ත කර ඇති උපාධිධාරී 52 දෙනෙකු ද සෑම දිස්ත්‍රික්කයක ම පාරිභෝගිකයන්, වෙළෙන්දන් හා නීතිය පිළිබඳ දැනුවත් කිරීම් හා පාරිභෝගික සමිති පිහිටුවීමට අනුයුක්ත කරන ලද විමර්ශන නිලධාරීන් / නිලධාරිනියන්ව අමතරව අනුයුක්ත කර ඇත.

4.2 **<u>නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්</u>**

(අ) මෙම මුදල නිදහස් කර ගැනීම සඳහා පාරිභෝගික කටයුතු පළිබඳ අධිකාරිය විසින් දිගින් දිගට ම උත්සාහ දරා තිබුණි. නමුත් මහා භාණ්ඩාගාරයට මේ සම්බන්ධව යම් පැහැදිලි කිරීම් කර ගැනීමට අවශ්‍යව තිබූ බැවින්, මුදල්, අධිකාරිය වෙත නිදහස් කිරීම ප්‍රමාද විය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඉලක්කගත වෙළඳපළ විමර්ශන කටයුතු පුළුල් කිරීම නිසා එකී දිස්ත්‍රික්කවලට ප්‍රවාහන පහසුකම් ලබාදීම අනිවාර්යයෙන් කළ යුතු විය. මේ සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මෙම තැන්පත් අරමුදල, 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු

පිළිබඳ අධිකාරිය පනතෙ 49(ඇ) ඡේදයේ බලතල ප්‍රකාරව, යොදා ගැනීමට මහා භාණ්ඩාගාරයෙන් අවසර ඉල්ලා සිටි අතර, ඒ සඳහා ලද අවසරය අනුව මෙම මුදල් පනතේ ප්‍රතිපාදන අනුව වියදම් කරන ලදී.

4.3 <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>

2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතට අනුව සාධාරණ වෙළඳ කොමිසමේ කාර්ය පටිපාටිය (Manual of Procedure) අනුව සාධාරණ වෙළඳ කොමිසමේ කාර්ය මණ්ඩලයේ සේවකයින් හට ඉතිරි කර ගත් වෛද්‍ය නිවාඩු 21 ක් සඳහා පනතට අනුව මාසික වැටුප ගෙවීම් කරන ලදි.

2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 73(2) (ආ) (vii) (අ) පරිදි 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවකයන් වන්නා වූ ද, අධිකාරියේ සේවා නියුක්තිය පිරිනමන ලද සහ එය භාරගන්නා ලද්දා වූ සියළු නිලධරයන් සහ සේවකයන් මෙම පනත (2003 පාරිභෝගික අධිකාරී පනත) ක්‍රියාත්මක වීම ආරමභ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ ඔවුනට ද <u>සේවා නියමයන් හා කොන්දේසිවලට වඩා අඩු වාසි සහගත නොවන සේවා නියම සහ කොන්දේසි</u> යටතේ අධිකාරියේ සේවයේ යොදවා ගත යුතුය යන්න නියම කර ඇත.

එම නියමය පදනම් කරගෙන අංක Ad/At/06 හා 2005 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් සාධාරණ වෙළඳ කොමිසම විසින් නිවාඩු දින දීමනා ගෙවූ ආකාරයට ම වෛද්‍ය නිවාඩු 21 සඳහා අනුමැතිය ලබාගෙන ඉහත 2 වන ඡේදයේ සඳහන් පරිදි පනතේ නියමයන්ට අනුව නිවාඩු දින දීමනා ගෙවීම කරනු ලබයි. එහෙත් 2013.01.01 දින සිට සියළුම නිලධාරීන් හා සේවකයින් සඳහා වෛද්‍ය නිවාඩු දින 21 සඳහා පමණක් ගෙවීම් සිදුකිරීම සඳහා පියවර ගෙන ඇති අතර, ඒ බව 2013.05.02 දිනැති මැමෝ පත්‍රය මගින් නිලධාරීන්ට දැනුම් දී ඇත.

මේ සඳහා තවදුරටත් භාණ්ඩාගාරයෙන් තහවුරු කර ගැනීමෙන් අවශ්‍ය ඉදිරි පියවරයන් ගන්නා බව ද සඳහන් කරමි.

4.4 <u>වෙනත් රජයේ ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්</u>

(අ) මෙම නිලධාරියා අධිකාරියේ මාධ්‍ය එකකයේ කටයුතු කරනු ලබන නිලධාරියකු වන අතර, සඳහන් මුදල් ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත. කෙසේ වුව ද 2012 පෙබරවාරි සිට මෙම දීමනාව රු.5,000/- ක් දක්වා අඩුකර ඇති අතර, අධිකාරියේ දුරකථන ජාලයට අයත් ජංගම දුරකථනයක් අධිකාරියෙන් මාධ්‍ය ඒකකය වෙත ලබා දී ඇත. කෙසේ වෙතත් 2012 පෙබරවාරි මස සිට කිසිදු දුරකථන බිල්පත් මෙම නිලධාරියා වෙනුවෙන් අධිකාරිය ගෙවා ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරිනියක් තාවකාලිකව ගරු අමාත්‍යතුමාගේ ඉංගිසි ලිපි යතුරු ලියනය සඳහා අනුයුක්ත කර තිබුණු අතර, මෙම නිලධාරිනිය අධිකාරියේ සේවයෙන් මේ වන විට සම්පූර්ණයෙන් ම ඉවත් කර ඇත.

(ආ) තාවකාලිකව අධිකාරියට අනුයුක්ත කරන ලද අමාත්‍යාංශයට අයත් ඩිෆෙන්ඩර් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අධිකාරිය විසින් දරා ඇති රු.3,361,475/- මුදල අමාත්‍යාංශයේ පවතින මුදල් ප්‍රතිපාදන මත අධිකාරිය වෙත ගෙවීමට එකඟ වී ඇති බව ලිඛිතව දන්වා ඇත.

4.5 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

(අ) මෙම අතපසුවීම ඉතා කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ආ) මේ වන විට තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය විධිමත් අනුමැතිය ලබාගෙන ඇත. එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අනුමැතිය පරිදි අදාළ විමර්ශන නිලධාරීන් බඳවාගෙන ඇත.

(ඇ) මෙම බඳවා ගැනීම හා ව ැටුප් පියවර තැබීම සම්බන්ධයෙන් 2011 නොවැම්බර් 14 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ වාර්තාවෙන් ඉල්ලා සිටින ලද අතර, එම වාර්තාව 2012 ඔක්තෝබර් 03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් එම වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව බඳවා ගැනීමේ හා වැටුප් වර්ධක දීම ගැටළු සහගත නොවන බැවින් එය 2012.10.03 වාර්තාවෙන් ඉවත් කර ඇත.

5. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

5.1 සංයුක්ත සැලැස්ම

අදාළ සංයුක්ත සැලැස්මෙහි අධිකාරියෙහි කාර්ය භාරය වසෙර් එක් එක් කාර්තුවල දී ඉටුකරනු ලබන්නේ කෙසේ ද යන්න ඉලක්ක සහිතව හ ඳුනාගෙන ඇත. එමෙන් ම එම ඉලක්ක ළඟාකර ගැනීමෙන් ප්‍රගතිය මැන බැලීම සඳහා ක්‍රියාකාරිත්වය මැන බැලීමේ දර්ශක ද (Performance indicators) සඳහන් කර ඇත. 2013 වසර සඳහා වර්ෂ 03 ක් වෙනුවෙන් සංයුක්ත සැලැස්ම අමාත්‍යාංශයේ දර්ශනය මෙන් ම අධිකාරියේ දර්ශනය හා මෙහෙවරට අනුගත වන පරිදි සකස් කර උපාය මාර්ග හා ඉලක්ක හඳුනාගෙන නිශ්චිත කාර්ය සාධනයක් සහිතව ක්‍රියාත්මක කරන බව දැනුම් දෙමි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ) 5.1 පිළිතුරෙහි පෙන්වා දී ඇති ආකාරයට අධිකාරියෙහි ක්‍රියාකාරී සැලැස්ම මගින් 2011 වර්ෂය සඳහා ළඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය 1 වන, 2 වන, 3 වන හා 4 වන කාර්තුව වශයෙන් ඉලක්ක සහිතව හඳුනාගෙන ඇති අතර, ඒ අනුව අපේක්ෂිත අරමුණු ඉටුවේ ද යන්න පිළිබඳව තහවුරු කර ගත හැක.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ 5.4a, 5.4b, 5.4c අනුව පුහුණු අවස්ථා හඳුනාගැනීම, කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩ සටහන් ලබාදීම හා ඇගයීම සියළුම අංශ ප්‍රධානීන් මගින් කළ යුතු බැව් ක්‍රියාකාරී සැලැස්මේ පෙන්වා දී ඇත. මෙසේ සිදුකරන ලද්දේ එක් එක් අංශය මගින් ඉටුකරනු ලබන කාර්ය භාරයට අදාළ පුහුණු අවශ්‍යතා අංශ ප්‍රධානීන් මගින් ලබාගෙන මානව සම්පත් හා පරිපාලන අංශය මගින් අදාළ සේවකයන් නියමිත පුහුණු වැඩ සටහන් සඳහා යොමු කිරීම වඩාත් ඵලදායී වන බැවිනි. ඔබගේ පෙන්වාදීම නිවැරදි වන බැවින් 2013 වසරේ එය නිවැරදි කිරීමට කටයුතු කරමි.

5.3 වාර්ෂික වාර්තාව

වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ දී විගණන වාර්තාව ඉංග්‍රීසි හා දෙමළ අනුවාදය පාරිභෝගික අධිකාරිය වෙත විගණනය විසින් ලබා දී ඇත්තේ 2011.11.22 දිනදීය. 2010 වාර්ෂික වාර්තා පොත් වෙනුවට සංයුක්ත තැටි ඉදිරිපත් කිරීමට සිදුවීමත් මෙය ප්‍රමාදයට හේතු විය.

5.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම.

(අ) අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු 2013.03.01 දින සිට බඳවාගෙන ඇති අතර, එම අයට සහායක නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර ඇත. අභ්‍යන්තර විගණන අංශය වඩාත් ශක්තිමත් කළ යුතු බැවින් කාර්ය මණ්ඩලයේ නොමැති වුවත් තවත් ගිණුම නිලධාරීන් දෙදෙනෙක් ද එම අංශයට අනුයුක්ත කිරීමට කටයුතු කොට ඇත. වැඩ බලන නිලධාරීන් දෙදෙනෙක් හැර අනෙක් තනතුරු සඳහා 2013.02.01 දින වන විට පුරප්පාඩු පුරවන ලදී. දැනට අධ්‍යක්ෂ (මිල කිරීම් හා කළමනාකරණ) තනතුර සහ සහකාර අධ්‍යක්ෂ (කලාප) තනතුර සඳහා පුරප්පාඩු පවතින අතර එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

(ආ) නව විමර්ශන නිලධාරීන් පුහුණු කිරීම සඳහා බඳවාගත් උපදේශකවරයාගේ සේවය 2011.12.31 දින සිට අවසන් කර ඇත.

5.5 **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

(අ) මෙසේ කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට සහභාගි නොවන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගේ සාමාජිකත්වය අහෝසි කිරීම සම්බන්ධව තීරණ ගැනීමට ගරු අමාත්‍යතුමා දැනුවත් කරන ලදී.

(ආ) රැස්වීම්වලට සහභාගි වන යහපත් මට්ටමක නොපවතින සාමාජිකයින් පිළිබඳව ද ගරු අමාත්‍යතුමා දැනුවත් කරන ලදී.

5.6 **අයවැය පාලනය**

ආයතනයේ කාර්ය භාරය විශාල වශයෙන් ව්‍යාප්ත කිරීමත් සමඟ විශේෂයෙන් ඉලක්කගත වැටලීම් හඳුන්වාදීමත් සමඟ ඒ හා සම්බන්ධ වියදම් ඇස්තමේන්තු ගත වියදම ඉක්මවා දැරීමට සිදුවිය. මෙම තත්ත්වය පාලනය කර අයවැය පාලනය තුළ වියදම් කිරීමට අවශ්‍ය පියවරයන් ඉදිරියේ දී කරනු ඇත.

6. **<u>පද්ධති පාලනයන්</u>**

විගණනය විසින් අනාවරණය කර ඇති පද්ධති පාලනයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිරියේ දී අවශ්‍ය කටයුතු කරන බව සඳහන් කරමි.

රුමී මර්ෂුක්
සභාපති